		ගමන්වියදම්	162,370.00	159,062.00	159,062.00	98%
		ලිපිද්‍රව්‍ය	40,000.00	39,989.50	39,989.50	100%
		ඉන්ධන	519,750.00	517,725.00	517,725.00	100%
		නිලඇදුම්	4,000.00	4,000.00	4,000.00	100%
		වාහනඅළුත් වැඩියා	174,230.00	174,230.00	174,230.00	100%
		දුරකථනදීමනා	60,852.13	49,390.46	49,390.46	81%
		විදුලියහා ජලය	17,091.00	17,089.38	17,089.38	100%
		වෙනත්	153,043.17	153,043.17	153,043.17	100%
		දේපළණය	266,557.97	278,764.58	278,764.58	105%
		යන්ත්‍රසූත්‍ර මිලදී ගැනීම	110,035.00	110,033.15	110,033.15	100%
		වාහන පුනරුත්තාපනය හා වැඩි දියුණුකිරීම්	378,900.00	378,900.00	378,900.00	100%
		දිස්ත්‍රික් කෘෂිකර්ම කම්ටුව	10,783,600.00	6,821,311.00	6,821,311.00	63%
		සෞභාග්‍යයානිෂ්පාදන වැඩසටහන	608,691.50	594,691.50	594,691.50	98%
		එළුවන්ඇති කිරීමේ ව්‍යාපෘතිය	1,485,000.00	1,485,000.00	1,485,000.00	100%
	118 - කෘෂිකර්ම අමාත්‍යාංශය(පොහොර ලේකම් කාර්යාලය)	වැටුප්	444,363.00	444,363.00	444,363.00	100%
		දීමනා	140,695.00	140,695.00	140,695.00	100%
		ඉන්ධන	53,630.00	53,570.00	53,570.00	100%
		වාහන අළුත් වැඩියා	33,983.00	33,983.00	33,983.00	100%
		වෙනත්	139,749.00	124,666.50	124,666.50	89%
		පොහොර සහනාධාර	147,228,600.00	121,146,219.00	121,146,219.00	82%
9	**122 - ඉඩම් අමාතයංශය**	වැටුප්	8,484,633.26	8,442,452.47	8,442,452.47	100%
		දීමනා	3,858,679.00	3,823,923.00	3,823,923.00	99%
		ගමන් වියදම්	574,740.86	513,371.36	513,371.36	89%
		දේපලණය	32,238.85	32,238.85	32,238.85	100%
		ඉඩම් අත්කර ගැනීම හා වන්දි ගෙවීම	159,174,595.45	155,770,434.24	155,770,434.24	98%

10	නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය	මිල්ලකන්ද වතුයාය නිවාස ව්‍යාපෘතිය	368,215.00	368,215.00	368,215.00	100%
			6,639,285.90	6,639,285.90	6,639,285.90	100%
11	අධ්‍යාපන අමාත්‍යාංශය (නිපුනතා)	ගමන්වියදම්	644,800.00	466,821.00	466,821.00	72%
		ලිපි ද්‍රව්‍ය	100,984.50	74,734.50	74,734.50	74%
		කළුතර පුරවර විශ්ව විද්‍යාලය	558,440.79	558,440.79	558,440.79	100%
12	අධ්‍යාපන අමාත්‍යාංශය (පිරිවෙන් අධ්‍යාපන අංශය)	සිරිප්‍රේමරත්න මූලික පිරිවෙන	771,950.00	751,949.36	751,949.36	97%
13	126 - කර්මාන්ත අමාත්‍යාංශය- කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය(විදාතා)	අනිකාල	29,973.08	29,973.08	29,973.08	100%
		ගමන් වියදම්	446,313.32	445,713.32	445,713.32	100%
		ගමන් වියදම්	97,490.00	96,790.00	96,790.00	99%
		යතුරුපැදි අළුත්වැඩියා	154,713.00	74,713.00	74,713.00	48%
		පරිගණක අළුත්වැඩියා	121,200.00	121,200.00	121,200.00	100%
		දුරකථන දීමනා	50,477.88	41,978.87	41,978.87	83%
		විදුලිය හා ජලය	131,635.86	121,382.11	121,382.11	92%
		බදු කුලී	13,982.92	13,982.92	13,982.92	100%
		වෙනත්	51,775.00	45,683.00	45,683.00	88%
		යන්ත්‍ර සූත්‍ර අළුත් වැඩියා	86,050.00	86,050.00	86,050.00	100%
		වෙනත්	5,441,749.28	5,441,749.28	5,441,749.28	100%
		ජර්නල් සටහන් මගින් මාරුකිරීම	4,046,432.13	4,046,432.13	4,046,432.13	100%
		ජර්නල් සටහන් මගින් මාරුකිරීම	7,728,804.03	7,728,804.03	7,728,804.03	100%
		වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම	77,250.00	69,050.00	69,050.00	89%
14	රාජ්‍යසේවා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය (උපාධිධාරී)	උපාධිධාරීවැටුප් -ස්ථිර	90,198,115.68	87,663,117.43	87,663,117.43	97%
		උපාධිධාරී දීමනා -ස්ථිර	78,043,920.99	72,410,229.20	72,410,229.20	93%
15	රාජ්‍ය සේවාපළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය (රාජ්‍ය භාෂා)	නාම පුවරුසකස් කිරීම	200,000.00	200,000.00	200,000.00	100%

16	**409 - රාජ්‍ය සේවා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය (සංචාරකඛංගලා)**	වැටුප්	606,305.90	589,805.90	589,805.90	97%
		දීමනා	416,756.00	412,522.00	412,522.00	99%
		විදේශ ගමන් සඳහා ප්‍රතිපාදන	1,000,000.00	1,000,000.00	1,000,000.00	100%
		වෙනත්	23,412.50	23,412.50	23,412.50	100%
		දුරකථන දීමනා	17,322.71	15,989.28	15,989.28	92%
		රුක් රෝපණ	65,000.00	65,000.00	65,000.00	100%
		ගොඩනැගිලි අළුත් වැඩියා සඳහා.නොගෙවූ බිල්පත්	3,000,000.00	3,000,000.00	3,000,000.00	100%
		ගොඩනැගිලි ඉදි කිරීම්	3,992,715.97	3,992,715.97	3,992,715.97	100%
		විදුලිය හා ජලය	184,999.83	184,999.83	184,999.83	100%
17	**130 - රාජ්‍ය සේවා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය (සැලසුම් අංශය)**	වැටුප්	391,278,618.16	388,059,651.39	388,059,651.39	99%
		අතිකාල	699,029.00	670,356.75	670,356.75	96%
		දීමනා	178,995,116.45	178,447,648.00	178,447,648.00	100%
		ගමන් වියදම්	2,378,026.95	2,373,364.55	2,373,364.55	100%
		ලිපි ද්‍රව්‍ය	180,000.00	180,000.00	180,000.00	100%
		ඉන්ධන	373,655.00	373,275.00	373,275.00	100%
		නිල ඇඳුම්	8,000.00	8,000.00	8,000.00	100%
		වෙනත්	32,000.00	32,000.00	32,000.00	100%
		වාහන	497,695.00	472,764.25	472,764.25	95%
		යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ	85,600.00	85,600.00	85,600.00	100%
		දුරකථන	591,472.84	537,471.83	537,471.83	91%
		විදුලිය හා ජලය	154,800.07	136,459.53	136,459.53	88%
		බදු කුලී	19,440.00	17,947.80	17,947.80	92%
		වෙනත්	105,438.00	104,843.00	104,843.00	99%
		දේපළ ණය පොලී	2,467,333.83	2,414,097.14	2,414,097.14	98%
		යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ	59,300.00	59,300.00	59,300.00	100%
		පුහුණු	80,000.00	80,000.00	80,000.00	100%

18	**409 -** රාජ්‍ය සේවා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය (ඉ ග්‍රාම නිලධාරී)	ඉ ග්‍රාමනිලධාරී	1,242,055.96	1,058,453.96	1,058,453.96	85%
19	**135 -** පොල් ,කිතුල් හා තල් වගා ප්‍රවර්ධනය හා ආශ්‍රිත කාර්මික භාණ්ඩ නිෂ්පාදන හා අපනයන විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යාංශය	කිතුල් නිෂ්පාදන ව්‍යාපෘතිය	8,353,303.00	8,353,303.00	8,353,303.00	100%
20	**151 -** ධීවර අමාත්‍යාංශය	Express Pearl	53,597,500.00	52,887,499.97	52,887,499.97	99%
21	**160 -**පරිසර අමාත්‍යාංශය	වැටුප්	1,917,435.00	1,910,760.00	1,910,760.00	100%
		දීමනා	918,000.00	918,000.00	918,000.00	100%
		සෝජාන් වගාව	3,370,554.18	3,370,513.86	3,370,513.86	100%
		හරිත ව්‍යවසායකත්ව වැඩසටහන	4,549,900.00	144,900.00	144,900.00	3%
		සුරකිමු ගංගා	3,919,514.48	3,019,514.48	3,019,514.48	77%
22	**166 -**ජල සම්පාදන අමාත්‍යාංශය	සනීපාරක්ෂාව පිළිබඳ ආසියානු සමුළුව	200,000.00	200,000.00	200,000.00	100%
23	**171 -**කාන්තා ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය	සෞභාග්‍යා	105,358,912.50	104,801,564.61	104,801,564.61	99%
		සමෘද්ධි අරුනළු/හරිත දැයක්	81,812,569.15	51,442,294.57	51,442,294.57	63%
		වැටුප්	5,635,543.76	5,562,700.20	5,562,700.20	99%
		දීමනා	2,615,955.00	2,439,707.39	2,439,707.39	93%
		ලිපි ද්‍රව්‍ය	22,200.00	22,200.00	22,200.00	100%
		ගමන් වියදම්-මනෝවිද්‍යා උපදේශක	193,045.00	171,682.00	171,682.00	89%
		ආබාධ සහිත පුද්ගලයන් සවිබලගැන්වීම	120,000.00	120,000.00	120,000.00	100%
		දිස්ත්‍රික් ළමා සංවර්ධන කමිටු	39,410.00	39,410.00	39,410.00	100%
		දේපළ ණය පොලී	62,119.68	55,595.85	55,595.85	89%
		පරිසණක අළුත්වැඩියා.	13,000.00	13,000.00	13,000.00	100%
		ගමන් වියදම් -වනිතා සංවර්ධන ක්ෂේත්‍ර සහකාර	563,661.94	554,561.00	554,561.00	98%
		ගුරු අභිමානී	42,444,509.64	39,051,000.00	39,051,000.00	92%
		පෙර පාසැල් උදෑසන ආහාර වේල	5,542,415.00	5,468,135.00	5,468,135.00	99%

		ප්‍රගති සමාලෝචන වැඩසටහන්	2,464,969.00	2,339,773.00	2,339,773.00	95%
		වයස අවු 70ට වැඩි වැඩිහිටි දීමනා	618,130,200.00	616,588,600.00	616,588,600.00	100%
		පෝෂණ දීමනා	217,162,785.24	206,402,785.24	206,402,785.24	95%
		දැනුවත් කිරීමේ වැඩසටහන්	282,500.00	282,500.00	282,500.00	100%
		ආරක්ෂණ සැලසුම්	392,638.42	392,638.42	392,638.42	100%
		අධි අවදානම් සහිත දරුවන් සඳහා ආධාර	275,000.00	275,000.00	275,000.00	100%
		ලිපි ද්‍රව්‍ය-වනිතා සංවර්ධන	8,000.00	7,250.00	7,250.00	91%
		මුල් ළමාවිය-ගමන් වියදම්	230,103.00	220,893.00	220,893.00	96%
		වකුගඩු රෝගීන්	30,490,000.00	30,412,500.00	30,412,500.00	100%
		ආබාධිත	219,864,900.00	174,757,500.00	174,757,500.00	79%
		වයස අවු 100 ඉක්මවූ පුද්ගලයන්ටදීමනාව	4,502,200.00	1,557,200.00	1,557,200.00	35%
		වයස අවු 70ඉක්මවූ පුද්ගලයන්ටදීමනාව	54,056,000.00	2,702,800.00	2,702,800.00	5%
		උපදේශන වැඩසටහන්	155,529.70	155,529.70	155,529.70	100%
		මුල් ළමාවිය සංවර්ධන සහකාර ලිපි ද්‍රව්‍ය	3,750.00	3,381.00	3,381.00	90%
24	**186 -තාක්ෂණ අමාත්‍යාංශය**	විදුලිබිල්පත්	3,206,656.86	2,704,168.47	2,704,168.47	84%
25	**189 -මහජන ආරක්ෂක අමාත්‍යාංශය**	වැටුප් හා දීමනා	793,872.03	793,716.74	793,716.74	100%
		වෙනත්	63,910.00	59,740.00	59,740.00	93%
26	**193 - ඵලදායිතා ලේකම් කාර්යාලය**	ගමන් වියදම්	568,783.00	509,946.00	509,946.00	90%
27	**193 - කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය**	ගමන් වියදම්	904,824.65	846,603.65	846,603.65	94%
		ලිපිද්‍රව්‍ය	175,000.00	175,000.00	175,000.00	100%
		මාසික ප්‍රගති සමාලෝචන රැස්වීම	54,800.00	54,800.00	54,800.00	100%
		මාසික ප්‍රගති සමාලෝචන රැස්වීම	54,000.00	54,000.00	54,000.00	100%
28	**194 තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය (කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය)**	ගමන්වියදම්	722,840.00	689,926.00	689,926.00	95%
		ලිපිද්‍රව්‍ය	195,175.00	153,964.00	153,964.00	79%
		වෙනත් සේවා	72,000.00	72,000.00	72,000.00	100%
		වාහන අළුත් වැඩියා	113,940.00	113,940.00	113,940.00	100%
		යන්ත්‍ර සුත්‍ර අළුත් වැඩියා	80,004.61	80,004.61	80,004.61	100%
		තැපැල් හා විදුලි සංදේශ	61,825.00	58,844.02	58,844.02	95%
		විදුලිය හා ජලය	84,321.25	45,601.00	45,601.00	54%

		බදු හා කුලී	10,080.00	10,080.00	10,080.00	100%
		වෙනත් සේවා	67,695.00	53,118.00	53,118.00	78%
		තරුණ ව්‍යවසායකත්ව පුහුණු	4,796,891.00	3,483,629.38	3,483,629.38	73%
		ක්‍රීඩාපිටි සංවර්ධනය.	31,360,672.00	29,775,889.57	29,775,889.57	95%
29	**149 - කර්මාන්ත අමාත්‍යාංශය**	තරුණ කෘෂිසමාගම් පිහිටුවීම	1,476,250.00	416,912.50	416,912.50	28%
30	**201 - බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව**	අතිකාල	134,813.82	50,628.00	50,628.00	38%
		ගමන් වියදම්	1,132,068.56	995,408.06	995,408.06	88%
		ලිපි ද්‍රව්‍ය	80,950.00	74,150.00	74,150.00	92%
		දිස්ත්‍රික් ත්‍රෛමාසික ප්‍රගතිසමාලෝචන රැස්වීම් සඳහා ප්‍රතිපාදන	10,400.00	6,900.00	6,900.00	66%
		සිල් මාතා රැස්වීම්	97,500.00	92,500.00	92,500.00	95%
		දහම් පාසල් ගුරු සහතික පත්‍ර				
		ආදාහන පූජෝත්සවය	2,120,475.00	2,102,975.00	2,102,975.00	99%
		ඌණ සංවර්ධිත දහම් පාසල් 2021 අතැති	2,181,017.20	1,544,907.20	1,544,907.20	71%
		දහම් සරසවි/දේශක දීමනා	336,900.00	207,800.00	207,800.00	62%
		දහම් පාසල් ගුරු දීමනා	40,848,700.00	38,915,800.00	38,915,800.00	95%
31	**202 - මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව**	මුස්ලිම් .සංස්කෘතික මධ්‍යස්ථාන වැඩිදියුණු කිරීම	1,723,400.00	1,303,400.00	1,303,400.00	76%
32	**206 සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය**	ආගමික සහජීවන වැඩසටහන්	233,500.00	217,626.00	217,626.00	93%
		දිස්ත්‍රික් සාහිත්‍ය තරඟ සඳහා	480,000.00	480,000.00	480,000.00	100%
		පුහුණු වැඩසටහන්	14,000.00	14,000.00	14,000.00	100%
		සාහිත්‍ය තරග පැවැත්වීම සඳහා	150,000.00	140,000.00	140,000.00	93%
		ගමන වියදම්	477,950.00	426,040.75	426,040.75	89%
		ලිපිද්‍රව්‍ය	47,250.00	41,000.00	41,000.00	87%
		දුරකතනදීමනා	75,250.00	31,456.63	31,456.63	42%
		වෙනත්	5,500.00	5,500.00	5,500.00	100%
		දොලොස්මහේ පහන වැඩසටහන -තෙවන	194,250.00	184,500.00	184,500.00	95%
		කලාකරු අවමංගල්‍යාධාර	20,371,150.00	2,016,150.00	2,016,150.00	10%
		රාජ්‍ය තර්තන උළෙල	20,000.00	20,000.00	20,000.00	100%

		කලායතන ආධාර	501,000.00	501,000.00	501,000.00	100%
		දොලොස්මහේ පහන වැඩසටහන -	90,000.00	65,835.00	65,835.00	73%
		ආගමික වැඩසටහන්	14,000.00	14,000.00	14,000.00	100%
		දොලොස්මහේ පහන -දෙවන කාර්තුව	102,000.00	102,000.00	102,000.00	100%
		දොලොස්මහේ පහන	90,000.00	90,000.00	90,000.00	100%
33	**210 - රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව**	අතිකාල	25,223.00	2,723.00	2,723.00	11%
		ගමන් වියදම්	117,360.00	108,897.00	108,897.00	93%
		ලිපි ද්‍රව්‍ය	12,000.00	12,000.00	12,000.00	100%
		වෙනත්	15,000.00	14,500.00	14,500.00	97%
		තැපැල් හා සන්නිවේදන	21,834.11	3,388.25	3,388.25	16%
		පුවත්පත් මිලදී ගැනීම	6,900.00	6,150.00	6,150.00	89%
		ගමන් වියදම්	11,750.00	10,000.00	10,000.00	85%
		යන්ත්‍රෝපකරණ	57,790.00	3,825.00	3,825.00	7%
34	**216 - සමාජ සේවා දෙපාර්තමේන්තුව**	වැටුප්	11,188,798.56	11,106,025.50	11,106,025.50	99%
		දීමනා	3,884,598.38	3,789,498.38	3,789,498.38	98%
		වෙනත්ව වියදම්	76,749.00	72,940.00	72,940.00	95%
		ගමන් වියදම්	405,360.00	357,384.00	357,384.00	88%
		ලිපිද්‍රව්‍ය	63,375.00	63,375.00	63,375.00	100%
		තැපැල් හා සන්නිවේදන	204,000.00	189,000.00	189,000.00	93%
		දේපළණය පොලී	371,485.58	236,785.56	236,785.56	64%
		සම්මුඛ පරීක්ෂණ/කුසලතා සංවර්ධන මධ්‍යස්ථානය	924,834.27	725,381.41	725,381.41	78%
		ප්‍රජාමත් නිවාරණ වැඩසටහන	437,500.00	427,175.00	427,175.00	98%
		සීබී ආර් වැඩසටහන	266,028.00	235,225.00	235,225.00	88%
		වැටුප් හා දීමනා	560,180.00	531,020.00	531,020.00	95%
35	**217 - පරිවාස හා ළමා රක්ෂක දෙපාර්තමේන්තුව**	ගමන් වියදම්	416,183.00	398,120.00	398,120.00	96%
		ලිපිද්‍රව්‍ය	54,000.00	54,000.00	54,000.00	100%
		වැසිකිලි පද්ධතිය අළුත් වැඩියා කිරීම	423,370.45	423,370.45	423,370.45	100%
		උපකරණ මිලදී ගැනීම(දරුවන්ට අවශ්‍ය)	183,622.59	183,622.59	183,622.59	100%
		දිස්ත්‍රික් ළමා සභා	961,630.00	927,540.00	927,540.00	96%
		වෛද්‍ය ආධාර	1,042,800.00	1,045,800.00	1,045,800.00	100%

36	**219 - ක්‍රීඩා සංවර්ධන අමාත්‍යාංශය**	ගමන් වියදම්	179,142.00	81,330.00	81,330.00	45%
		ලිපිද්‍රව්‍ය	44,300.00	18,950.00	18,950.00	43%
		දක්ෂතා හඳුනා ගැනීම් වැඩසටහන සඳහා	540,793.00	540,793.00	540,793.00	100%
		පුහුණුකරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා	30,800.00	30,800.00	30,800.00	100%
37	**227 - පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව**	වැටුප්	14,034,952.55	14,018,395.86	14,018,395.86	100%
		දීමනා	6,191,640.44	6,167,186.01	6,167,186.01	100%
		ගමන් වියදම්	8,240.40	8,240.00	8,240.00	100%
		ලිපි ද්‍රව්‍ය	493,002.00	492,975.50	492,975.50	100%
		දුරකථන දීමනා	24,000.00	24,000.00	24,000.00	100%
		දේපළ ණය පොලී	163,719.81	163,719.81	163,719.81	100%
38	**247 - ශ්‍රීලංකා රේගුව**	ජලනල පද්ධතිය අළුත්වැඩියාකිරීම	204,547.06	117,612.20	117,612.20	57%
39	**248 - ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව**	අළුත්වැඩියා	950,000.00	918,419.29	918,419.29	97%
40	**252 - ජනලේඛණ හා සංඛ්‍යාලේඛණ දෙපාර්තමේන්තුව**	අතිකාල	88,284.00	64,729.00	64,729.00	73%
		ගමන් වියදම්	523,715.00	494,540.00	494,540.00	94%
		ලිපිද්‍රව්‍ය	31,999.00	31,999.00	31,999.00	100%
		ඉන්ධන	131,325.00	130,405.00	130,405.00	99%
		වාහනඅළුත් වැඩියා	59,510.00	59,510.00	59,510.00	100%
		යන්ත්‍රෝපකරණඅළුත් වැඩියා	30,912.95	21,402.79	21,402.79	69%
		දුරකථනදීමනා	35,560.05	30,621.80	30,621.80	86%
		විදුලියහා ජලය	125,621.43	89,890.35	89,890.35	72%
		වෙනත්	267,150.00	251,188.96	251,188.96	94%
		වෙනත්	1,600.00	1,600.00	1,600.00	100%

41	**253 - විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව**	අතිකාල	107,670.00	71,926.80	71,926.80	67%
		ගමන් වියදම්	38,977.00	36,886.00	36,886.00	95%
		සිවිල් විශ්‍රාම වැටුප්	200,715,815.75	200,715,815.95	200,715,815.95	100%
		තැපැල්	446,750.00	343,856.97	343,856.97	77%
		මුද්‍රණ වියදම්	417,500.00	377,500.00	377,500.00	90%
		වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප්	86,713,368.12	86,713,368.12	86,713,368.12	100%
		මාරුකිරීම්	1,967,255.00	1,967,255.00	1,967,255.00	100%
42	**290 - ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව**	විස්මා ජලස් ගොඩනැගිල්ල ඉදි කිරීම	3,380,003.67	3,380,003.67	3,380,003.67	100%
43	**203 - පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුව**	දීමනා	8,369,500.00	7,995,000.00	7,995,000.00	96%
44	**307 - මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව**	අතිකාල	135,000.00	133,051.00	133,051.00	99%
		ලිපි ද්‍රව්‍ය	49,750.00	19,560.00	19,560.00	39%
		ඉන්ධන	20,000.00	19,000.00	19,000.00	95%
		යන්ත්‍ර හා යනත්‍රෝපකරණ	125,000.00	111,661.54	111,661.54	89%
		ගොඩනැගිලි නඩත්තු	25,000.00	23,800.00	23,800.00	95%
		දුරකථන දීමනා	118,733.80	102,483.19	102,483.19	86%
		විදුලිය හා ජලය	614,671.23	617,312.14	617,312.14	100%
		බදු කුලී	14,400.00	14,400.00	14,400.00	100%
		ආරක්ෂක වියදම්	1,044,992.00	990,812.00	990,812.00	95%
		රියදුරු බලපත්‍ර පරීක්ෂණ ගාස්තු	139,016.00	138,130.00	138,130.00	99%
		රියදුරු බලපත්‍ර පරීක්ෂණ ගාස්තු	600,000.00	600,000.00	600,000.00	100%
		වෙනත් පරිපාලන වියදම්	20,000.00	13,750.00	13,750.00	69%
		ගොඩනැගිලි ඉදි කිරීම්	4,863,388.50	4,863,388.50	4,863,388.50	100%

45	**326 - ප්‍රජාපාදක විශෝධන දෙපාර්මේන්තුව**	ලිපි ද්‍රව්‍ය	17,227.00	17,227.00	17,227.00	100%
46	**327 - ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැළසුම් දෙපාර්තමේන්තුව**	ගමන් වියදම්	439,496.00	423,978.00	423,978.00	96%
		ලිපි ද්‍රව්‍ය	28,000.00	28,000.00	28,000.00	100%
		විදුලියහා ජලය	8,046.45	8,046.45	8,046.45	100%
		සංවර්ධන ව්‍යාපෘති	396,060.00	361,065.00	361,065.00	91%
		සංවර්ධන ව්‍යාපෘති	176,925.00	152,746.00	152,746.00	86%
47	**328 - මිනිස්බල සහ රැකීරක්ෂා පොර්තමේන්තුව**	ගමන් වියදම්	884,412.50	795,627.50	795,627.50	90%
		ලිපිද්‍රව්‍ය	32,200.00	32,200.00	32,200.00	100%
		කැපැල්	25,176.95	25,176.95	25,176.95	100%
		ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන්	97,600.00	97,600.00	97,600.00	100%
		මානව සම්පත් පැනිකඩ සැකසීම-ලිපි ද්‍රව්‍ය	96,000.00	71,964.50	71,964.50	75%
		වෘත්තීය මාර්ගොපදේශ වැඩසටහන්	34,470.00	34,470.00	34,470.00	100%
		පුවත්පත් මිලදී ගැනීම	13,880.00	10,011.84	10,011.84	72%
48	**334 - බහුකාර්ය සංවර්ධන කාර්ය සාධක බලකාදෙපාර්තමේන්තුව**	වැටුප්	10,927,886.09	10,824,793.76	10,824,793.76	99%
		දීමනා	484,822,054.34	403,296,796.60	403,296,796.60	83%
		ලිපි ද්‍රව්‍ය	685,000.00	684,887.00	684,887.00	100%
		ගමන් වියදම්	832,213.00	622,221.10	622,221.10	75%
		දුරකථන	3,253.38	3,253.38	3,253.38	100%
		විදුලිය හා ජලය	12,287.93	12,287.92	12,287.92	100%
		දේපළ ණය පොලී	85,980.41	62,439.13	62,439.13	73%
		විදුලි පංකා මිලදී ගැනීම	11,035.00	11,035.00	11,035.00	100%
		විදුලි පංකා මිලදී ගැනීම	17,500.00	17,500.00	17,500.00	100%

3.8.මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

වත්කම් කේතය	කේත විස්තරය	**31.12.2022** දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	**31.12.2022** දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේ දී ගිණුම් කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	1,372,400,683.90	1,372,400,683.90	-	-
9152	යන්ත්‍රෝපකරණ	265,127,528.18	265,127,528.18	-	-
9153	ඉඩම්	1,027,013,100.00	1,027,013,100.00	-	-
9160	කෙරිගෙන යන වැඩ	275,762,780.14	275,762,780.14	-	-
		2,940,304,092.22	**2,940,304,092.22**		

4

පරිච්ඡේදය

කාර්ය සාධක දර්ශක

4.1.ආයතනයේ කාර්ය සාධක දර්ශක(ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම			
	100% - 90%	75% - 89%	74% - 50%	40%
ව්‍යාපාර නාම බලපත්‍ර නිකුත් කිරීම			67%	
උප්පැන්න හා විවාහ සහතික නිකුත් කිරීම	100%			
ජාතික හැඳුනුම්පත් නිකුත් කිරීම	96%			
ඉඩම් බදු ලබාදීම			73%	
ගම සමඟ පිළිසඳරක් වැඩසටහන යටතේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම				2% *

*ජාතික අයවැය චක්‍රලේඛයේ අංක 03/2022හි 3වන ඡේදයට අනුව දේශීය අරමුදල් භාවිතයෙන් සිදුකරන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී වියදම් පාලන ක්‍රම වේදයන් අනුගමනය කලයුතු වීම නිසා සැලසුම් කල පරිදි ව්‍යාපෘති ක්‍රියාත්මක කලනොහැකි වීම

5 පරිච්ඡේදය

තිරසර සංවර්ධන අරමුණු (SDG සපුරා ගැනීම)

5.1 හඳුනා ගන්නා ලද අදාල තිරසාර සංවර්ධන අරමුණු

ඉලක්ක	තිරසර සංවර්ධන අභිමතාර්ථ	අරමුණු	සංවර්ධන ක්‍රියාකාරකම්	ජයග්‍රාහී දර්ශක	මේ දක්වා ලබා ගෙන ඇති ප්‍රගතිය		
					0% - 49%	50% -74%	75%-100%
සවිමත් යටිතල පහසුකම් ගොඩනැගීම, පරිපූර්ණ හා තිරසර කාර්මීකරණය ප්‍රවර්ධනය කර නව්‍යකරණය දිරිගැන්වීම	9	කාර්යක්ෂම හා ඵලදායී ලෙස භාවිතා කළ හැකි ආපදාවන්ට ඔරොත්තු දෙන අන්දමෙහි සවිමත් ග්‍රාමීය මාර්ග පද්ධතියක් ඇති කිරීම හා නිසි ජල ප්‍රවාහන පද්ධතියක් ඇති කිරීම.	ගම සමඟ පිළිසඳර වැඩසටහන හා සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන යටතේ පාරවල් කාපට් කිරීම,පාරවල් තාර දැමීම,පාරවල් කොන්ක්‍රීට් කිරීම,පාරවල් ගල් අතුරා සකස් කිරීම,බොරළු පාරවල් සකස් කිරීම,පාරවල්ලව පැති බැමි ඉදිකිරීම,බෝක්කු පාලම්,කාණු ඉදිකිරීම,සුළු වාරිමාර්ග පද්ධති ඉදිකිරීම,ප්‍රජා ශාලා,බහුකාර්යය ගොඩනැගිලි,සේවා පියස ඉදිකිරීම,වැසිකිලි ඉදිකිරීම	සංවර්ධනය කළ මාර්ගවල දිග ප්‍රමාණය		62%	
		සමාජ ආර්ථික සංවර්ධනය	ඌණ සංවර්ධිත විහාරස්ථාන වැඩි දියුණු කිරීම, ඌණ සංවර්ධිත දහම් පාසල් සඳහා උපකරණ ලබාදීම,මුස්ලිම් ආගමික සිද්ධස්ථාන ප්‍රතිෂ්ඨාපනය කිරීම යටතේ විහාරස්ථාන දහම් පාසල් ගොඩනැගිලි වැඩි දියුණු කිරීම,ග්‍රාමීය ක්‍රීඩාපිටි ඉදිකිරීම	විහාරස්ථානයට යන සැදැහැවතුන් ගණන හා ඔවුන්ගේ අධ්‍යාත්මික සංවර්ධනය			
සාගින්න නැතිකර ආහාර සුරක්ෂිතතාවය සහ යහපත් පෝෂණ තත්ත්වයක් දිනාගෙන තිරසර කෘෂිකර්මාන්තයක් ප්‍රවර්ධනය කිරීම	2	ආහාර නිෂ්පාදනය වැඩි කිරීම	සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන තුළින් රටේ ආර්ථිකයශක්තිමත් කිරීමට උද්යෝගයක් ඇති කිරීම	නිෂ්පාදන ගම්මාන සංඛ්‍යාව			70%
			ගම සමඟ පිළිසඳර වැඩසටහන යටතේ අපනයන බෝග වගාවට අදාළ පැළ බෙදාදීමේ හා හරිත දැයක් වැඩසටහන යටතේ ගෙවතු වගා ක්‍රියාත්මක කිරීම	ලබාදුන් පැළ සංඛ්‍යාව			

5.2. තිරසර සංවර්ධන ළඟාකර ගැනීමේ ජයග්‍රහන හා අභියෝග

අප ආර්ථිකයේ ව්‍යුහයේ විශාලතමයා වූ ග්‍රාමීය අංශය තිරසර සංවර්ධන පරමාර්ථ සාක්ෂාත් කර ගැනීමෙහිලා වැදගත් මෙහෙයක් ඉටු කරයි..ග්‍රාමීය කෘෂිකාර්මික ජීවන රටාවක් අනුගමනය කරන බහුතරයක් වූ ග්‍රාමීය ජනගහනය ධාන්‍ය අල,බතල වැවෙන පොල්,පුවක්,කොස්,දෙල් එල දරන වාණිජ එළවළු කොටු කුඩා පරිමාණ තේ,රබර් වතු පලා කොටු,වී වගාව,සරුසාර පොල් වතු,පළතුරු බෝග මේ සියලු ගොවිකම් කරමින් සවිමත් ග්‍රාමීය කෘෂි ආර්ථිකයක් ගොඩනඟමින් දිස්ත්‍රික්කය ශක්තිමත් කරමින් සිටී.

සීඝ්‍රයෙන් නාගරීකරණයට ලක්වෙමින් වේගයෙන් ජනගහනය වර්ධනය වන අප දිස්ත්‍රික්කය අවට උප නාගරික ප්‍රදේශවල පවතින රැකියා අවස්ථාවන් වෙත ග්‍රාමීය අංශයේ තරුණ ශ්‍රමිකයන් සංක්‍රමණය වීම ඉතා අඩුය.කෘෂිකාර්මික ශ්‍රම බලකායෙන් එසේ විතැන්වන තාරුණ්‍යය බොහෝ දුරට වැඩිදුර අධ්‍යාපනය නොලත් නුපුහුණු හෝ අර්ධ පුහුණු ශ්‍රමිකයන් ගණයට වැටේ.

ග්‍රාමීය අංශය තුල තවදුරටත් ජනතාව රදවා තබා ගන්නට නම් සමාජ ආර්ථික වශයෙන් ඔවුන් ඔසවා තබන්නට සමත් ජීවනෝපායන් ගම තුල පැවතීම අනිවාර්යය වේ.ගම තුල සේවාවන් දුලබය.සේවාවට ගැලපෙන කර්මාන්ත නිහය.කවර හෝ කෘෂිකර්මාන්තයක නියැලෙන්නන්ට ප්‍රමාණවත් ශ්‍රමය හා භූමිය නොඅඩුව තිබේ.කෘෂිකාර්මික අංශය ඌණ සේවා නියුක්තියෙන් පෙලේ.

ජීවනෝපාය සංවර්ධනය තුළින් ග්‍රාමීය නිෂ්පාදන ආර්ථිකය ශක්තිමත් කර,ගෘහ ආර්ථික හා ආහාර සුරක්ෂිතතාවය තහවුරු කිරීම උදෙසා ජීවනෝපාය ශක්තිමත් කරමින් රැකියා උත්පාදනය කොට,ජාතික නිෂ්පාදනය ඉහල නැංවීම කෙරෙහි ප්‍රමුඛ අවධානය යොමු කරමින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය දැනුම හා අත්දැකීම් පසුගිය වසර පුරාම ලබාදෙන ලදි.

විවිධ අමාත්‍යාංශ යටතේ විවිධ වැඩසටහන් සඳහා ප්‍රතිපාදන වෙන් වුවත් එම වැඩසටහන් තිරසර සංවර්ධන ඉලක්කවලට මධ්‍යගත වූ වැඩසටහන් නොවීම,සියළුම නිලධාරීන් තිරසර සංවර්ධන අභිමාර්ථ පිළිබඳ මනා දැනුවත් වීමක් සිදුනොවීම අභියෝගාත්මකය.

තවද 2022 වර්ෂයේ දෙවන කාර්තුව ආරම්භයේ සිටම රටේ පැවති ආර්ථික අර්බුදය නිසා අනුමත වූ වැඩ සටහන් අතරමඟ නතර කිරීමට සිදුවිය.එනමුත් ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් තුලින් ආර්ථික හා සමාජයීය වශයෙන් ගැටළු ඇතිවීම අවම කිරීම සඳහා තිරසර සංවර්ධන ඉලක්ක කේන්ද්‍ර ගතවූ වැඩසටහන් සකස් කිරීම අභියෝගයක්ව පවති.

එමෙන්ම මෙම අභියෝග හමුවේ කාර්යක්ෂමව හා ඵලදායි ලෙස භාවිතා කල හැකි ආපදාවන්ට ඔරොත්තු දෙන අන්දමේ සවීමත් ග්‍රාමීය මාර්ග පද්ධතියක් ඇතිකිරීමේ අරමුණ පෙරදැරිව සවිමත් යටිතල පහසුකම් ගොඩනැගීම ඉලක්ක කර ගනිමින් දිස්ත්‍රික්කය 62%ක ප්‍රගතියක් අත්කර ගනිමින් මාර්ග,බෝක්කු.පාලම් සංවර්ධනය කර ඇති අතර,70%ක පැල බෙදාදීම් සිදුකර ඇත.

06 පරිච්ඡේදය

මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු / (අතිරික්ත)**
ජ්‍යෙෂ්ඨ	75	74	01
තෘතියික	56	32	24
ද්විතියික	2423	2544	121**
ප්‍රාථමික	167	151	16

6.2 ** මානව සම්පත් හිඟය ආයතනයේ කාර්ය සාධනය කෙරෙහි බලපාන ආකාරය

ආයතනයේ දෛනික රාජකාරි සඳහා ඉහත පරිදි මානව සම්පත් හිඟයක් පැවතුනද,විවිධ පුහුණු වැඩසටහන් මඟින් නිලධාරින්ගේ හැකියා දැනුම,ආකල්ප හා ධාරිතා සංවර්ධනය කර තිබීම තුලින් ඇතිවන ගැටළු මහහරවා ගෙන කටයුතු කරගෙන යනු ලබයි.

6.3 මානව සම්පත් සංවර්ධනය

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ත ආයෝජනය (රු'000)		වැඩසටහනේ ස්වභාවය (දේශීය / විදේශීය)	නිමැවුම / ලබාගත් දැනුම*
			දේශීය	විදේශීය		
Web Update	13	දින 01	3,450.00		දේශීය	
ඵලදායිතාවය හා තත්ත්වකව පිළිබඳ පුහුණුව	88	දින 01	28,180.00		දේශීය	
රාජ්‍ය සේවයේ සාමාන්‍ය හැසිරීම හා විනය	60	දින 01	25,985.00		දේශීය	
සහකාර ප්‍රාදේශිය ලේකම්ගේ කාර්යභාරය	14	දින 01	15,000.00		දේශීය	
රජයේ ඉඩම් කළමණාකරණය	27	දින 01	54,337.00		දේශීය	
සටහන් ලිවීම හා ලිපිගොණු නඩත්තුව	29	දින 01	23,420.00		දේශීය	
Computer Hardware & Net Working	15	දින 04	21,600.00		දේශීය	
Ms Excel	15	දින 04	21,600.00		දේශීය	
Database Manegment	11	දින 05	28,725.00		දේශීය	
අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් ලෙස සහකාර ප්‍රදේශිය ලේකම්ගේ කාර්යභාරය	14	දින 01	13,850.00		දේශීය	
විශ්‍රාම වැටුප්(සහකාර ප්‍රාදේශිය ලේකම්වරුන් සඳහා)	13	දින 01	9,115.00		දේශීය	
බදු පාලන ගිණුම	42	දින 01	35,055.00		දේශීය	
සමෘද්ධි වැඩපිළිවෙල පිළිබඳ සහකාර ප්‍රාදේශිය ලේකම්වරුන්ගේ කාර්යභාරය	13	දින 01	15,940.00		දේශීය	
රජයේ වාහන නඩත්තුව	50	දින 01	47,700.00		දේශීය	
Web Update	12	දින 05	22,350.00		දේශීය	
Ms Office(Basic)	25	දින 10	54,300.00		දේශීය	
Database Management	13	දින 05	156,700		දේශීය	
විනය කාර්ය පටිපාටිය	42	දින 01	25,200.00		දේශීය	
පුද්ගලික ලිපිගොණු සකස් කිරීම හා නඩත්තුව	60	දින 01	26,010.00		දේශීය	
තොරතුරු පනත	30	දින 01	18,100.00		දේශීය	
රජයේ ඉඩම්	55	දින 01	27,915.00		දේශීය	
වැටුප් පරිවර්තනය	57	දින 01	21,800.00		දේශීය	
ප්‍රසම්පාදන ක්‍රියාවලිය	57	දින 02	45,100.00		දේශීය	
ප්‍රමාණ සමීක්ෂණය	31	දින 01	17,900.00		දේශීය	

7 පරිච්ඡේදය

අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ/ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබීම**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම්(වාණිජ අත්තිකාරම් ගිණුම්)	-		
1.4	ගඩබා අත්තිකාරම් ගිණුම	-		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අනුකූල වේ		
1.6	වෙනත්	-		
2	**පොත්පත් හා ලේඛණ නඩත්තු කිරීම (මූ.රෙ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛණය යාවත්කාලීනව පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛණය යාවත්කාලීනව පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛණය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛණය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS)පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇනවුම් ලේඛණය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛණය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛණය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛණය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛණය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛණය (GA-N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
3	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මූ.රෙ.135)**			

3.1	මුල්‍ය බලතල ආයතනය තුල බලතල පවරාදීම	අනුකූල වේ		
3.2	මුල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුල දැනුවත් කිරීම	අනුකූල වේ		
3.3	සෑම ගණුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදි ගණකාධිකාරිගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට(NBD)නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට,සියළුම විගණන විමසුම්වලට පිළිතුරු ලබාදී තිබීම	ඇතැම් විගණන විමසුම් සඳහා අනුකූල නොවේ	ප්‍රාදේශිය ලේකම් කාර්යාලවලින් පිළිතුරු ලබා ඉදිරිපත් කල යුතු විම	ප්‍රාදේශිය ලේකම් කාර්යාල වෙත ගොස් පිළිතුරු සකස් කර ලබාගැනිම
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ.134(2) DMA/1-2019 අනුව වසර ආරම්භයේදි විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව,අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුලදි පිළිතුරු සපයා තිබීම	ඇතැම් විගණන විමසුම් සඳහා අනුකූල නොවේ	ප්‍රාදේශිය ලේකම් කාර්යාලවලින් පිළිතුරු ලබා ඉදිරිපත් කල යුතු විම	ප්‍රාදේශිය ලේකම් කාර්යාල වෙත ගොස් පිළිතුරු සකස් කර ලබාගැනිම
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4)උප වගන්තිය ප්‍රකාරව,සියළුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
6.4	මුදල් රෙගුලාසි 134(3)ප්‍රකාරව,සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
7	**විගණන කළමණාකරණ කමිටු**			
7.1	DMA චක්‍ර ලේඛ 1-2019 අනුව,අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04ක් වත් අදාළ වර්ෂය තුල පවත්වාගෙන යාම	අනුකූල වේ		
8	**වත්කම් කළමනාකරණය**	අනුකූල වේ		
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍ර ලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව වත්කම් මිලදි ගැනිම හා අපහරණය කිරීම පිළිබඳ කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		

8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව එම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධිකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත්කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොමිස්ට්‍රොලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව,භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපති වරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත,ඌනතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුල සිදුකොට තිබීම	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ 772 අනුව සිදු කිරීම	අනුකූල වේ		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස්කොට නියමිත දිනට විගණාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
9.2	වාහන ගර්හිත වී මාස 06කට වඩා අඩු කාලයකදි අපහරණය කිරීම	අනුකූල වේ		
9.3	වාහන ලොග් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ.103,104, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව,වාහනවල ඉන්ධන දහනය විමනැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ		
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව,බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරාගෙන තිබීම	අනුකූල වේ		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේදි හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ හා ගැලපුම් කල යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුලත නිරවුල් කර තිබීම	අනුකූල නොවේ	ප්‍රායෝගිකව මාසයක කාලයක් ප්‍රමාණවත් නොවීම	
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා දි තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ.94(1)ප්‍රකාරව,සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කල පසු වර්ෂ අවසානයේදි ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එලබීම	අනුකූල නොවේ	කලයුතු අත්‍යවශ්‍ය ගෙවීම් සිදු කිරීම	

12	**රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුම**			
12.1	සීමාවන්ට අනුකූල වීම	අනුකූල වේ		
12.2	හිගහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදුකර තිබීම	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල වේ		
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මූ.රෙ.571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල වේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
14	**අග්‍රිම ගිණුම**	අනුකූල වේ		
14.1	සමාලෝචිත වර්ෂ අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ		
14.2	මූ.රෙ 371 ප්‍රකාරව නිකුත් කල තත්කාර්ය අතුරු අග්‍රිම,එම කාර්යය අවසන් වී මාසයක් ඇතුලත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
14.3	මූ.රෙ 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය,භණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසිවලට අනුකූලව රැස්කල ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අනුකූල වේ		
15.2	රැස් කර තිබූ ආදායම තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අනුකූල වේ		
15.3	මූ.රෙ.176 අනුව හිඟ ආදායම් වාර්තා විගණාධිපතිවරයාට වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සිමාව තුල කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම	අනුකූල වේ		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේනතුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබාදීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා / චෝදනා පල කිරීමට පහසුකම් සකසා තිබීම	අනුකූල වේ		

17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2018 හා 05/2018 (1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල වේ		
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතනය විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොටතිබීම	අනුකූල වේ		
19.2	කාර්යය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම අවම වශයෙන් පැය 12 ට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුල තහවුරු කොට තිබීම	අනුකූල වේ		
19.3	ඉහත සඳහන් චක්‍ර ලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්යය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල වේ		
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම	අනුකූල වේ		
20	**විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ		

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. WPCG/KL/A/6/22/23/2

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2023 මැයි 24 දින

දිස්ත්‍රික් ලේකම්,
කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය.

කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථාකාලයේ දී නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේ දී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම්, විගණකගේ වගකීම් යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.

+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේ දී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේ දී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදි. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේ දී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුල දී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය,

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පිළියෙල කරන ලද මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයට අනුව භාණ්ඩාගාර අග්‍රිම ලැබීම් ලෙස රු.5,233,258,423 ක් දක්වා තිබුණ ද මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කර තිබුණු 2022 වර්ෂය සඳහා අග්‍රිම ගිණුම් පිළිබඳ ප්‍රකාශයට අනුව භාණ්ඩාගාරයෙන් අග්‍රිම ලැබීම් වටිනාකම රු.4,920,762,000 ක් වූයෙන් එම වටිනාකම් අතර රු.312,496,423 ක නොසැසඳීමක් නිරීක්ෂණය විය.

1.6.2 අග්‍රිම ගිණුම් පිළිබඳ ප්‍රකාශය

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණු අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ වෙනත් ආයතන විසින්, වාර්තා කරන ආයතනය වෙනුවෙන් දරන ලද වියදම් රු.148,752 ක් වැඩියෙන් ද අනෙකුත් ආදායම් ශීර්ෂ වෙනුවෙන්, වාර්තා කරන ආයතනය විසින් එකතු කරන ලද ආදායම් එම වටිනාකමින් අඩුවෙන් ද දක්වා තිබුණි.

1.6.3 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

1.6.3.1 මූල්‍ය නොවන වත්කම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2021 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කර තිබුණු ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල සඳහන් මූල්‍ය නොවන වත්කම් 08 ක අවසන් ශේෂයන්, 2022 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කර තිබුණු සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන වල මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයට අනුව (ACA-6/SA 82) එකී වත්කම්වල ආරම්භක ශේෂ එකතුව සමඟ සැසඳීමේදී රු.310,597,605 ක නොසැසඳුනු වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) 2022 දෙසැම්බර් 31 දිනට සිගාස් (CIGAS) වැඩසටහන අනුව වූ මූල්‍ය නොවන වත්කම් සංචලන වාර්තාව ප්‍රකාරව සමාලෝචිත වර්ෂය අවසානයේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 14 හි කෙරීගෙන යන වැඩ වටිනාකම රු.388,756,237 වුවද මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයට (ACA-6 ප්‍රකාශය) අනුව එදිනට කෙරීගෙන යන වැඩ වටිනාකම රු.275,762,780 වූයෙන් එකී ශේෂ අතර රු.112,993,457 ක නොසැසඳීමක් නිරීක්ෂණය විය.

(ඇ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය නොවන වත්කම් උප ලේඛනයට අනුව වර්ෂය තුළ මිලදී ගත් හා අපහරණය කරන ලද මූල්‍ය නොවන වත්කම්වල එකතුව පිළිවෙලින් රු.50,848,337 ක් හා රු.6,275,253 ක් සමාලෝචිත වර්ෂය වෙනුවෙන් වූ මූල්‍ය නොවන වත්කම් වාර්තාවේ මිලදී ගැනීම් හා ඉවත් කිරීම් යටතේ ඇතුළත් කර නොතිබුණි.

(ඈ) 2022 ජනවාරි 01 දිනට භාණ්ඩාගාර වගු SA 82 හි පරිදි මූල්‍ය නොවන වත්කම් වාර්තාවේ ආරම්භක ශේෂ සඳහා ගැලපුම් වලට (opening balance adjustment) අදාල අනුමැතීන්, ජ'නල් සටහන් සහ උපලේඛන විගණනයට ඉදිරිපත් නොවුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල මූල්‍ය නොවන වත්කම් වාර්තාවේ කෙරීගෙන යන වැඩ (WIP) ලෙස දක්වා ඇති එකතුව රු.153,768,738 ක වටිනාකමකින් යුතු නව කාර්යාල ගොඩනැගිලි අදාල කාර්යාල කටයුතු සඳහා 2020 සහ 2022 වර්ෂවල සිටම භාවිතා කලද 2022 දෙසැම්බර් 31 දිනටත් කෙරීගෙන යන වැඩ (WIP) යටතේ තවදුරටත් දක්වා තිබුණි,

1.6.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන අභ්‍යන්තර විගණක වෙතින් කැඳවන ලද තොරතුරුවලට අනුව, ගෙවීම් වවුචර් පරීක්ෂාවේ දී ප්‍රාදේශීය ලේකම් කාර්යාල 06 කට අදාළ විගණනයට ඉදිරිපත් නොවූ එකතුව රු., 3,978,090 ක් වටිනා ගෙවීම් වවුචර් 22 ක් පැවති බව නිරීක්ෂණය විය. එම හිඟ වවුචර් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 272 ප්‍රකාරව කටයුතු කර නොතිබුණ අතර සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක iv තුල අස්ථාන ගත වවුචර් පිළිබඳ ප්‍රකාශයේ හිඟ වවුචර් සම්බන්ධ තොරතුරු අනාවරණය කිරීමට ද ගණන්දීමේ නිලධාරී කටයුතු කර නොතිබුණි.

1.6.3.3 ලේඛන හා පොත්පත් පවත්වා නොකිබීම

මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව පවත්වා ගත යුතු විගණනයට ඉදිරිපත් කල බැරකම් ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 වියදම් කළමනාකරණය

විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණු මූල්‍ය ප්‍රකාශන සමග වූ සමාලෝචිත වර්ෂය සඳහා වූ වියදම් ප්‍රකාශයට (ඒසීඒ-2 (ii)) අනුව මූලධන හා පුනරාවර්තන වැය විෂයයන් 15 ක් සඳහා ලබා දී තිබුණු එකතුව රු.219,720,000 ක වාර්ෂික අයවැය ගත මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.191,688,042 ක් පමණක් උපයෝජනය කර තිබුණ හෙයින් ඉතිරි වීම් රු.28,031,958 ක් වූ අතර එම ඉතිරි වීම්

සංශෝධිත ඇස්තමේන්තුවේ ප්‍රතිශතයක් ලෙස සියයට 6.25 සිට සියයට 100 දක්වා වූ පරාසයක විය. එසේ වුවද ඉතිරි වීම් සඳහා දක්වා තිබූ හේතු ප්‍රකාරව මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශ ලේකම්ගේ අංක BD/ICT/04 හා 2022 සැප්තැම්බර් 23 ලිපියෙහි උපදෙස් අනුව වැය විෂයන් 08 ක හතර වන කාර්තුව සඳහා වන කාර්තුමය වැය සීමාවන්ට ගැලපීම් සිදුකර තිබුණි.

2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

(අ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ආකෘතියේ බැරකම් පිලිබඳ ප්‍රකාශයට අනුව අදාළ ගිණුම් වර්ෂය ඇතුලත භාණ්ඩ, සේවාවන් හෝ ඉදිකිරීම් කොන්ත්‍රාත්තුවලට අදාළ වත්කම් හා සේවාවන් ලැබී ඇති නමුත් ගිණුම් වර්ෂය තුල දී ඒ සඳහා අදාළ පාර්ශවයන්ට ගෙවීම් සිදු කර නොමැති ගනුදෙනු බැරකම් ලෙස හඳුනාගත යුතු වුවද, 2023 වර්ෂයේ ගෙවීම් වවුවර් පිළිබඳව සිදුකල නියැදි විගණන පරීක්ෂාවේ දී හඳුනාගත් එම කොන්දේසිය සපුරා ඇති වැය විෂයයන් 07 කට අදාල රු.1,876,047 ක් හා ප්‍රාදේශිය ලේකම් කාර්යාල 03 කට අදාලව අවසන් ගිණුම්වල බැරකම් ලෙස දක්වා තිබුණු රු.654,798 ක් බැරකම් ලෙස හඳුනා ගෙන නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ බැරකම් රු. 2,530,845 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) වාර්ෂික ඇස්තමේන්තු මගින් වෙන්කරදී තිබුණු ප්‍රතිපාදන සීමාවන් ඉක්මවා බැරකම් වලට නොබැදිය යුතු වුවත් සමාලෝචිත වර්ෂයේදී වැයවිෂයයන් පහක (05) ඉතිරිවීම් රු.351,480 ක්ද ඉක්මවා රු.1,104,869 ක බැරකම් වලට එලඹ තිබුණි.

2.3 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(අ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) විගණකාධිපතිවරයාට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාලසීමාවන් තුළ සියළුම විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම සිදු වන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු වුවත්, වාර්තාවේ 3.4 ඡේදය ප්‍රකාරව විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී නොතිබුණි.

2.4 නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති,රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

නීති,රීති හා රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධාන	
i. XXIV පරිච්ඡේදයේ 4.4 වගන්තිය	වසර 3 කට හා 5 කට පෙර මිය ගිය නිලධාරීන් දෙදෙනෙකුට අදාළ එකතුව රු.331,133 ක ණය ශේෂයක් අදාළ විධිවිධාන ප්‍රකාරව සමාලෝචිත වර්ෂය අවසානයටත් නිරවුල් කර ගෙන නොතිබුණි.
ii. XXIV පරිච්ඡේදයේ 4.2.2, 4.2.4, 4.2.5, 4.5, 4.6 හා 6.3	නිලධාරියා විශ්‍රාම ගොස් මාස 0-3 අතර කාලසීමාවක් ගත වී තිබුණ ද අය කර නොගත් රු.205,989 ක ණය ශේෂයක් විය.
iii. XXIV පරිච්ඡේදයේ 4.5 හා 4.6	විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නිරවුල් කර නොගත් වැඩ තහනම් කරන ලද නිලධාරීන් 03 දෙනෙකුගෙන් සමාලෝචිත වර්ෂය අවසානයට අය විය යුතු එකතුව රු.517,893 ක ණය ශේෂයක් විය.
iv. XXIV පරිච්ඡේදයේ 4.5 හා 4.6 වගන්ති	තනතුර හැර ගිය නිලධාරියකුගෙන් අය විය යුතු එකතුව රු.115,000 ක ණය ශේෂ සමාලෝචිත වර්ෂය අවසානය දක්වාත් විධිවිධාන ප්‍රකාරව කටයුතු කර අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි	
	(i) මුදල් රෙගුලාසි 396(ඇ)	2022 දෙසැම්බර් 31 දිනට බැංකු ගිණුම් 05 කින් නිකුත් කර තිබූ වටිනාකම රු.1,786,752 ක්වූ කල් ඉකුත් වී මාස 1 ත් මාස 14 ත් අතර කාල පරාසයක් සහිත චෙක්පත් 17 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.
	(ii) මුදල් රෙගුලාසි 756	සමාලෝචිත වර්ෂයට අදාළ භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තා 2023 අප්‍රේල් 28 දින දක්වාත් විගණකාධිපතිවෙත ඉදිරිපත් කර නොතිබුණි.
(ඇ)	2019 මැයි 31 දිනැති අංක 14/2019 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය	ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02 ක විශ්‍රාම වැටුප් ලිපි ගොනු 117 ක් 2022 දෙසැම්බර් 31 දිනටත් චක්‍රලේඛය ප්‍රකාරව සංශෝධනය කර නොතිබුණි.
(ඇ)	2019 මැයි 30 දිනැති අංක 02/2019 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ලිපිය, 06 ඡේදය	මිය ගිය විශ්‍රාමිකයන්ගේ තොරතුරු කාලීනව ලබාගෙන විශ්‍රාම වැටුප් ලබන්නන්ගේ නාමලේඛනය යාවත්කාලීන නොකිරීම මත පානදුර, බෙරුවල, හොරණ හා ඉංගිරිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල 2022 දෙසැම්බර් 31 දිනට මිය ගිය විශ්‍රාමිකයන් වෙනුවෙන් අවිධිමත් ලෙස වැඩිපුර ගෙවීම් කර තවදුරටත් අයකර ගත යුතු රු.5,179.949 ක අධි භාර මුදලක් පැවතුණි.
(ඉ)	1996 අංක 22 දරන පනත මගින් සංශෝධනය කරන ලද 1916 අංක 33 දරන (182 අධිකාරිය වන) තුවක්කු ආඥා පනත හා 2022 සැප්තැම්බර් 14 දිනැති අංක 02/2022 දරණ ආරක්ෂක අමාත්‍යාංශ චක්‍රලේඛය	
	i. 5(1), 22(1), 22(2)(උ), 23(1) හා 23(3) වගන්ති හා චක්‍රලේඛයේ 3.4 වගන්තිය	බලපත්‍ර අලුත් කිරීමකින් තොරව හා එම ගිනිඅවි තාවකාලිකව බාරදීමකින් තොරව හොරණ හා පානදුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල පිළිවෙලින් ගිනි අවි 15 ක් හා 22 ක් පුද්ගලයන් විසින්

සන්තකයේ තබා ගෙන ඇති බවත් ඒවා අතරින් හොරණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ගිනි අවි 12 ක් වසර 10 සිට 20 දක්වා කාලසීමාවකින් ද පානදුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ගිනි අවි 20 ක් වසර 06 සිට 10 දක්වා කාලසීමාවකින් ද බලපත්‍ර අළුත් කළ බවට සාක්ෂි ඉදිරිපත් කරන ලදී.

ii. චක්‍රලේඛයේ 3.6 වගන්තිය

ගිනිඅවි බලපත්‍ර අලුත්කිරීමේදී ගිනි අවියේ අවශ්‍යතාවය තවදුරටත් පවතින බවට තහවුරු කර ගැනීම සඳහා අදාල වගා ඉඩම්, සත්ත්ව ගොවිපළ පැවතීම පිළිබඳව පත්ඉරු හෝ සහතික කළ ඔප්පු පිටපත් ලබාගත යුතු වුවද නියැදි පරීක්ෂාවට ලක්වූ හොරණ, පානදුර හා ඉංගිරිය ප්‍රා.ලේ. කාර්යාල එලෙස කටයුතු කර නොතිබුණි.

iii. චක්‍රලේඛයේ 4.1 වගන්තිය

වයස අවුරුදු 65-70 අතර පුද්ගලයින් සඳහා ගිනිඅවියක් භාවිතා කිරීමට සුදුසු කායික හා මානසික තත්වයකින් පසුවන බවට රජයේ පිළිගත් වෛද්‍යවරයකුගෙන් ලබාගත් වෛද්‍ය සහතිකයක් නොමැතිව නියැදි පරීක්ෂාවට ලක්වූ, පානදුර හා ඉංගිරිය ප්‍රා.ලේ. කාර්යාල විසින් 2023 වර්ෂයේ පුද්ගලයින් 09 දෙනෙකු සඳහා ගිනිඅවි බලපත්‍ර ලබා ගැනීමට නිර්දේශ ලබා දී තිබුණි.

(ඊ) අංක DSK/ADM/11/4/පොදු හා 2015 ජූලි 03 දිනැති දිස්ත්‍රික් ලේකම් ගේ උපදෙස් ලිපිය හා අංක 1/9/2 දරණ ප්‍රාදේශීය ලේකම් ගේ 2015 අගෝස්තු 14 දිනැති උපදෙස් ලිපිය

ක්ෂේත්‍ර නිලධාරීන්ගේ ඉදිරි වැඩසටහන පවත්නා මාසයේ 25-30 දින අතර කාලයේදීත් කළ වැඩසටහන් අදාළ මාසයට පසු මාසයේ 1-5 දින අතර කාලයේදීත් අනුමැතිය සඳහා ඉදිරිපත් කළ යුතු වුවද කලුතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ක්ෂේත්‍ර නිලධාරීන්ගේ ඉදිරි වැඩ සටහන් සහ කළ වැඩසටහන් එලෙස ඉදිරිපත් නොකළ අවස්ථා නිරීක්ෂණය විය.

2.5 තැන්පතු

සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට පොදු තැන්පත් ගිණුම් 6 ක එකතුව රු.345,324,668 ක ශේෂයක් පැවති අතර ඒ අතරින් පොදු තැන්පත් ගිණුම් 5 කට අදාළව වසර දෙකක් ඉක්ම වූ නිරවුල් කර නොතිබූ එකතුව රු.96,328,508 ක තැන්පතු ශේෂයක් නිරීක්ෂණය විය. එසේම එකී ශේෂය තුල එකතුව රු.18,141,909 ක් වූ වසර 5 ක් ඉක්ම වූ තැන්පතු ද පැවතුණි. මේ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571(3) විධිවිධාන ප්‍රකාරව පවතින අඩුපාඩු හා දෝෂ නිවැරදි කර අදාළ පාර්ශව වෙත තැන්පත් මුදල් ගෙවා දැමීම හෝ රජයේ ආදායමට බැර කිරීමට හෝ විධිමත් පියවර ගෙන නොතිබුණි..

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

3.1.1 සැලසුම් කිරීම

සමාලෝචිත වර්ෂය සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර තිබුණ ද 2014 පෙබරවාරි 17 දිනැති අංක 1/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව ඇතුළත් විය යුතු විස්තරාත්මක තොරතුරු ඇතුළත් කර නොතිබුණ බව නිරීක්ෂණය විය.

3.1.2 භාවිතයට නොගත් ව්‍යාපෘති

පොල්, කිතුල් හා තල් වගා ප්‍රවර්ධන හා ආශ්‍රිත කාර්මික භාණ්ඩ..... රාජ්‍ය අමාත්‍යාංශය විසින් කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත 431-02-03-09-2507 වැය විෂය යටතේ 2021 වර්ෂයේදී මුදා හැර තිබුණු ප්‍රතිපාදන යටතේ පාලින්දනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ තීනියාවල ග්‍රාම නිලධාරී වසමේ සිදුකර තිබූ කිතුල් සංවර්ධන මධ්‍යස්ථාන ගොඩනැගිල්ලේ ප්‍රතිසංස්කරණය සඳහා රු.7,552,300 වැයකර ගොඩනැගිල්ල වටා වැටක් ගසා ප්‍රවේශ මාර්ගය ඉන්ටලොක් ගල් යොදා 2021 වර්ෂය අවසාන වන විට නිමකර තිබුණද විගණිත දිනයවූ 2023 පෙබරවාරි 24 වන දක්වාම ගොඩනැගිල්ල කිසිදු ප්‍රයෝජනයකට නොගෙන පවතින බව නිරීක්ෂණය වූ අතර ගොඩනැලිල්ල පවත්වා ගෙන යාමේ වගකීම හෝ අධීක්ෂණය කිසිදු වගකිවයුතු පාර්ශවයක් වෙත පැවරීමද සිදුකර නොතිබුණි .

3.1.3 ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්

කළුතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සඳහා නව ගොඩනැගිල්ලක් ඉදිකිරීම 2017 පෙබරවාරි 13 දින ආරම්භ කළ ද කොන්ත්‍රාත්කරු ඉදිකිරීම් අතරමඟ නවතා දැමීමේ හේතුවෙන් 2018 අගෝස්තු මස වන විට ව්‍යාපෘතිය සම්පූර්ණයෙන්ම ඇණ හිට නැවතත් ගොඩනැගිල්ලේ ඉතිරි වැඩ ඉන් වසර දෙකකට පසුව 2020 වර්ෂයේ නව කොන්ත්‍රාත්තුවක් ලෙස ආරම්භ කර තිබුණි. මෙම කොන්ත්‍රාත්තුව 2022

පෙබරවාරි 10 අවසන්වීමට නියමිතව තිබුණද. රට තුළ පැවති වසංගත තත්ත්වය, සංචරණ සීමා හා ඉදිකිරීම් භාණ්ඩ හිඟතාවය යන විවිධ හේතු මත ඉදිකිරීම් කාලය 2022 ජූලි 15 දින දක්වා කාලය දීර්ඝ කිරීම් සිදුකර තිබුණි. එසේ වුවද 2021 වර්ෂයේ සිට නැවතත් මෙහි ඉදිකිරීම් නවතා දමා තිබීම හේතුවෙන් මෙම වාර්තාව නිකුත් කරන දින දක්වා ම ගොඩනැගිල්ල වැසි වලට පාත්‍ර වෙමින් ගොඩනැගිල්ලේ අනාගත පැවැත්මට හානිදායක තත්ත්වයකට පත්වෙමින් පැවතුණු අතර ඉදිකිරීම් කටයුතු ආරම්භ කර වර්ෂ 06 ක් ඉක්මවා තිබුණ ද අපේක්ෂිත අරමුණු සඳහා භාවිතා කිරීමට නොහැකි වීම මත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට විවිධ සේවා ලබාගැනීම සඳහා පැමිණෙන මහජනතාව මෙන් ම කාර්ය මණ්ඩලයද දැඩි ලෙස දුෂ්කරතා වලට ලක්වෙමින් පැවතුණි. දෙවන අදියර සඳහා කොන්ත්‍රාත්කරු වෙත රු.39,569,971 ක් ගෙවාතිබූ අතර ගෙවන ලද බිල්පත් සහ මේ වන විට නිම කරන ලද වැඩ වටිනාකම අතර වෙනසක් පැවතිය හැකි බවත්, වැඩබිම ඇති ඉදිකිරීම් ද්‍රව්‍ය (material at site) සඳහා ගෙවීම් කර ඇතත් එම ද්‍රව්‍ය කොන්ත්‍රාත්කරු විසින් වැඩ බිමෙන් ඉවත් කර ගෙන ඇති බැවින් ඒ සියල්ල කොන්ත්‍රාත්කරුගෙන් අයකරගත යුතු බවත් මෙම ඉදිකිරීම් කොන්ත්‍රාත්තුවේ උපදේශක ලෙස කටයුතු කරන ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් පෙන්වා දී තිබිණි. කෙසේ වුවද රජයට අයවිය යුතු අත්තිකාරම් මුදල හා වැඩබිම තිබූ ඉදිකිරීම් ද්‍රව්‍ය සඳහා ගෙවිය යුතු මුදල් ගෙවීමට කොන්ත්‍රාත්කරු 2023 පෙබරවාරි 22 දින පැවති සාකච්ඡාවේදී එකඟ වී තිබුණද අවසන් බිල්පත 2023 අප්‍රේල් 26 වගණිත දින දක්වාත් ඉදිරිපත් නොකිරීම හේතුවෙන් රජයට අය විය යුතු මුදල ගණනය කිරීම සිදුකර නොතිබිණි. කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කරන ලද වටිනාකම රු.19,739,864 ක බැංකු ඇපකරයන්හි වලංගු කාලය 2022 දෙසැම්බර් 31 දින ඉක්ම යාමට පෙර වැඩිපුර ගෙවීම් අයකර ගැනීමට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් කටයුතු කර නොතිබුණි.

3.1.4 දේශීය අරමුදල් යෙදවූ ව්‍යාපෘති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වලල්ලාවිට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සඳහා නව ගොඩනැගිල්ලක් ඉදිකිරීම - ඉතිරි වැඩ කර්මාන්තය රු. 51,000,000 ක මුළු පිරිවැය ඇස්තමේන්තුවක් යටතේ ඉටුකර තිබුණු අතර එහිදී අතිරේක වැඩ වෙනුවෙන් කොන්ත්‍රාත්කරු ඉල්ලම්කල මිලට වඩා වැඩිපුර ගෙවීම, අදාල ගොඩනැගිලි ශාස්තු උප ලෙඛණයේ සඳහන් මිලට වඩා වැඩිපුර ගෙවීම හා භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණයවූ ප්‍රමාණවලට වඩා වැඩියෙන් ගෙවා තිබීම ආදී කරුණු හේතුවෙන් රු.921,457 ක් වැඩියෙන් ගෙවා තිබුනු අතර කර්මාන්තයේ නිම කිරීමට අදාළව වැඩ අවසන් කළ බවට වාර්තාවක් (completion certificate) , වෙනස් කිරීමට අදාළව කොන්ත්‍රාත්කරු විසින් ලබාදෙන සැලසුම් (Shop drawing) , වැඩ නිම කළ පසු ලබාදෙන සැලසුම් (as built drawing), විදුලි උපාංග සම්බන්ධව වරලත් විදුලි ඉංජිනේරු වාර්තාවක් , වොරන්ටි සහ

ගැරන්ටි සහතික සහ කොන්ත්‍රාත්කරු ගේ වගකීම් සහතිකය යන කිසිවක් විගණනයට ලබා දී නොතිබුණි. එසේම ඉදිකිරීමේදී ඇස්තමේන්තුවේ සඳහන් වැඩ විෂයන් 65 ක් අත්හැර තිබූ අතර, එම අත්හළ වැඩ වල මුළු වටිනාකම රු.10,893,740 ක් විය. මෙම අත්හළ වැඩ, වෙනස් කිරීම් සහ අතිරේක වැඩ සඳහා 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.13.4 පරිදි වාර්තා පිළියෙල කර අනුමැතීන් ලබාගෙන නොතිබුණු අතර දිනකට ප්‍රමාද ගාස්තු රු.6,278 ක් අඩුවෙන් දක්වා ගිවිසුම් ප්‍රකාරව අයකලයුතු රු.3,295,654 ක ප්‍රමාද දඩ මුදල් අයකර නොතිබුණි. මාසික ප්‍රගති වාර්තා නොමැති වීම හා වැඩ සැලැස්මක් නොමැති වීම හේතුවෙන් ප්‍රමාදය නිවැරදි හා සාධාරණ ද යන්න නිශ්චය කල නොහැකිවීම නිසා මිල විචලනය සඳහා ගෙවා තිබූ රු.1,027,556 ක මුදල නිවැරදිද යන්න විගණනයට තහවුරු නොවීය.

(ආ) මදුරාවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සඳහා නව ගොඩනැගිල්ලක් ඉදිකිරීම - ඉතිරි වැඩ කර්මාන්තය රු. 53,000,000 ක මුළු පිරිවැය ඇස්තමේන්තුවක් යටතේ ඉටුකර තිබුණු අතර එහිදී සියලුම අත්හළ වැඩ, වෙනස් කිරීම් සහ අතිරේක වැඩ වෙනුවෙන් අදාළ ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ ලිඛිත ඉල්ලීම්, වගකිව යුතු නිලධාරීන්ගේ නිර්දේශ නොතිබුණු අතර කර්මාන්තය ඉදිකිරීම් කාලයට කොන්ත්‍රාත්කරු ගෙන් වැඩ සැලැස්මක් (Work Programme) ලබාගෙන නොතිබුණු අතර කාර්යයට අදාල වැඩ සැලැස්මක් ද ලබාදී නොතිබුණි. කර්මාන්තය නිම කිරීමට අදාළව වැඩ අවසන් කළ බවට වාර්තාවක් (completion certificate) , වෙනස් කිරීමට අදාළව කොන්ත්‍රාත්කරු විසින් ලබාදෙන සැලසුම් (Shop drawing) , වැඩ නිම කළ පසු ලබාදෙන සැලසුම් (as built drawing), විදුලි උපාංග සම්බන්ධව වරලත් විදුලි ඉංජිනේරු වාර්තාවක් , වොරන්ටි සහ ගැරන්ටි සහතික සහ කොන්ත්‍රාත්කරු ගේ වගකීම් සහතිකය යන කිසිවක් විගණනයට ලබා දී නොතිබුණි. එසේම ඉදිකිරීමේදී ඉංජිනේරු ඇස්තමේන්තුවට අදාලව වැඩ විෂයන් 54 ක් අත්හැර තිබූ අතර, එම අත්හළ වැඩ වල මුළු වටිනාකම රු.5,673,089 ක් විය. දිනක ප්‍රමාද ගාස්තුව රු.7,650 ක් අඩුවෙන් දක්වා ගිවිසුම් ප්‍රකාරව අයකලයුතු , රු.3,650,016 ක ක ප්‍රමාද දඩ මුදල් අයකර නොතිබුණු අතර. ප්‍රසම්පාදන කමිටුව මගින් 2021 දෙසැම්බර් 31 දක්වා කාලය කාලය දීර්ඝ කිරීම් කර තිබුනද කොන්ත්‍රාත්තුව ආරම්භ කිරීමේදී සහ කාලය දීර්ඝ කිරීම් සිදුකරන විට වැඩ සැලැස්මක් ඉදිරිපත් කර නොතිබීම මත මෙන්ම දිස්ත්‍රික් ඉංජිනේරු අංශය විසින් කොන්ත්‍රාත්තු සම්බන්ධයෙන් කිසිදු අවස්ථාවක ප්‍රගති වාර්තා පිළියෙල කර නොතිබීම නිසාද එම දීර්ඝ කිරීම් විගණනයේදී පිළිගත නොහැකිවිය..

(ඇ) පාලින්දනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ තීනියාවල ග්‍රාම නිලධාරී වසමේ සිදුකර තිබූ කිතුල් සංවර්ධන මධ්‍යස්ථාන ගොඩනැගිල්ලේ ප්‍රතිසංස්කරණය සඳහා ඉංජිනේරු ඇස්තමේන්තුව සකස් කිරීමේදී කුමන ගොඩනැගිලි ගාස්තු උපලේඛනයක් (BSR) පදනම් කරගත්තේ ද යන්න සඳහන් කර නොතිබූ අතර ඒ ඒ අයිතම සඳහා අදාල කරගත් ප්‍රමාණයන් (quantities) තහවුරු කරගැනීමට ස්ථානයේදී ලබාගත් ප්‍රමාණ ඇතුලත් කර මිනුම් පත්‍රයක් හෝ සටහන් පත්‍රයක්

පිලියෙල කර නොතිබුණි. ගොඩනැගිල්ල නවීකරණයේදී සිදුකළ අතිරේක වැඩ වෙනුවෙන් ගෙවීම් කිරීම සඳහා අදාළ පාර්ශවයන්ගේ ලිඛිත ඉල්ලීම් හා ඒ සඳහා වගකිව යුතු පාර්ශවයන්ගේ නිර්දේශ ලබාගෙන නොතිබුණි. ගිවිසුම්ගත කාල සීමාව තුළ කර්මාන්තය නිම කිරීමට කොන්ත්‍රාත්කරු ගෙන් වැඩ සැලැස්මක් (Work Programme) ලබාගෙන නොතිබූ අතර කාර්යයට අදාල වැඩ සැලැස්මක් ද ලබාදී නොතිබුණි. කර්මාන්තයේ වැඩ අවසන් කළ බවට වාර්තාවක් (completion certificate) , වෙනස් කිරීම්වලට අදාළව කොන්ත්‍රාත්කරු විසින් ලබාදෙන සැලසුම් (Shop drawing), වැඩ නිම කළ පසු ලබාදෙන සැලසුම් (as built drawing) විදුලි උපාංග සම්බන්ධව වරලත් විදුලි ඉංජිනේරු වාර්තාවක්, ඔවරන්ටි සහ ගැරන්ටි සහතික සහ කොන්ත්‍රාත්කරු ගේ වගකීම් සහතිකය යන කිසිවක් විගණනයට ලබා දී නොතිබුණි. ගොඩනැගිල්ලේ කුඩා කාමර දෙකක සවිකර ඇති KDK වර්ගයේ සිවිලිං විදුලි පංකා දෙකක් ක්‍රියාත්මක කළහැකි පරිදි සවිකර නොතිබුණ ද ඒ සඳහා ගෙවීම් සහතික කර රු. 34,240 ක් ගෙවා තිබුණි. ප්‍රධාන ප්‍රවේශ දොරටු දෙකක් හා ගොඩනැඟිල්ල ඇතුළත දොරටු තුනක් ද වශයෙන් දොරවල් 05 අගුළු දමා වැසිය නොහැකි වුවද ඒ සඳහා රු.49,683 ක් ගෙවීම් කර තිබුණි.

(ඇ) සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන - 2021 යටතේ ප්‍රාදේශිය ලේකම් කාර්යාල 07 ක ක්‍රියාත්මක කර තිබුණු ව්‍යාපෘති සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය.

(i) පාලින්දනුවර ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන යටතේ කිතුල් නිෂ්පාදන අලෙවි මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා රු. 2,932,679 ක් ද ප්‍රතිලාභීන් වෙත කිතුල් නිෂ්පාදන ආශ්‍රිත උපකරණ ලබාදීම සඳහා රු. 2,148,000 ක්ද වශයෙන් රු.5,080,679 ක් වැයකර ක්‍රියාත්මක කර තිබුණු කිතුල් නිෂ්පාදන ගම්මාන ව්‍යාපෘතිය සම්බන්දයෙන් සිදුකළ භෞතික පරීක්ෂාවේදී ඉදිකර වසරක් ඉක්ම යාමට පෙර අලෙවි මධ්‍යස්ථානයේ ගොඩනැගිල්ලේ පිටුපස හා හා පැති බිත්ති වල සැලකියයුතු මට්ටමේ ඉරිතැලීම් සහ පිපිරීම් දක්නට ලැබුණු අතර ගඟට බැසීම සඳහා සකස් කරන ලද අත් වැට සහිත පඩිපෙල සම්බන්ධව අවසන් බිල්පතේ වැඩ අයිතම අංක A6 යටතේ රු.8,660 ක් ගෙවා තිබුණු තණ පිඩලි දක්නට නොවීය. අවසන් බිල්පතේ අයිතම අංක E4 යටතේ කොන්ක්‍රීට් පුටු හා මේස කට්ටල (Garden Chairs Set) දෙකක් සඳහා රු.49,500 ගෙවා තිබුණද භෞතික පරීක්ෂාවේදී දක්නට ලැබුණේ එක් කොන්ක්‍රීට් පුටු හා මේස කට්ටලයක් පමණි. ඒ අනුව රු.24,750 ක් වටිනා කොන්ක්‍රීට් පුටු හා මේස කට්ටලයක ඌනතාවයක් විය. මෙම ව්‍යාපෘතිය යටතේ කිතුල් නිෂ්පාදන කර්මාන්තයේ යෙදෙන තෝරාගත් ප්‍රතිලාභීන් 05 දෙනෙකුට කිතුල් නිෂ්පාදනාගාර ඉදිකිරීමට අමුද්‍රව්‍ය ලබාගැනීම සඳහා එක් අයෙකුට රු.100,000 බැගින් ප්‍රතිපාදන සලසා තිබුණු අතර ඉතිරිය ප්‍රතිලාභියාගේ දායකත්වයෙන් නිෂ්පාදනාගාරය ඉදිකළ යුතු විය. නියැදි භෞතික පරීක්ෂාවේදී, ප්‍රතිලාභීන් වෙත සිමෙන්ති

කොට්ට, බ්ලොක් ගල්, ඇස්බැස්ටස් තහඩු, ටයිල් කැට සහ මිලි මීටර 10 කම්බි ලබාදුන් බවට බඩු වට්ටෝරු ලේඛනයේ ඇතුළත් කර ප්‍රතිලාභියා ද ඒවා ලබාගත් බවට අත්සන් යොදා තිබුණ ද, අදාල භාණ්ඩ ලබාදී තිබුණු ගෙඩනැගිළි ද්‍රව්‍ය වෙළඳ සැලෙන් ලබාගත් බවට අත්සන් යොදා තිබුණු සියලුම ද්‍රව්‍ය ප්‍රතිලාභීන්වෙත නොලැබී තිබුණු අතර ඇතැම් ද්‍රව්‍ය වෙනුවට ඒවායේ වටිනාකම් සඳහා වෙළඳසැලෙන් මුදල්ද ලබාදී තිබුණි. කෙසේ වුවද භෞතික පරීක්ෂාවේදී ප්‍රතිලාභීන් තිදෙනෙකු විසින්ම නිෂ්පාදනාගාර ගොඩනැගිල්ල ලින්ටල් මට්ටම ආසන්නයට බිත්ති පමණක් බැඳ අත්හැර දමා තිබුණු බැවින් ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු ඉටුවී නොතිබුණි.

(ii) සෞභාග්‍යා ව්‍යාපෘතිය යටතේ හොරණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් ක්‍රියාත්මක කළ බිම්මල් වගාව ආශ්‍රිත නිෂ්පාදන වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය සම්බන්දයෙන් සිදුකළ භෞතික පරීක්ෂාවේ දී ප්‍රතිලාභීන් 09 දෙනෙකු වෙත ලබාදුන් රු.187,414 වටිනා ද්‍රව්‍ය සහ උපකරණ උෆන උපයෝජනයට ලක් කර තිබූ අතර අපේක්ෂිත අරමුණු ඉටුවී නොතිබුණි.

(iii) සෞභාග්‍යා ව්‍යාපෘතිය යටතේ බෙරුවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් ක්‍රියාත්මක කළ ව්‍යාපෘතිය යටතේ සිය ගොවිබිම් ආරක්ෂා කර ගැනීමට එක් ප්‍රතිලාභියෙකුට මීටර 3 ක් උස මීටර 50 ක් දිග කෘෂි ආරක්ෂණ දැල් රෝල් 3 බැගින් ප්‍රතිලාභීන් 45 දෙනෙකුට ලබා දී තිබුණ ද 2023 ජනවාරි 23 දින වන විටත් විගණනයට ඉදිරිපත් කර තිබූ තොරතුරුවලට අනුව එම දැල් භාවිතා කර ගොවිබිම ආරක්ෂා කර තිබුණේ ගොවීන් 5 දෙනෙකු විසින් පමණි. මේ අනුව ඉතිරි ගොවීන් 40 දෙනාම ඉහත සඳහන් දින වන විටත් තමන් විසින් ලබාගත් කෘෂි ආරක්ෂණ දැල් භාවිතයෙන් ගොවිබිම් සකස් කර නොතිබූ අතර ඒ අනුව රුපියල් 3,060,000 ක් වටිනා දැල් කිසිදු ඵලදායී කටයුත්තකට යොදා නොතිබීම හේතුවෙන් ව්‍යාපෘතියේ අපේක්ෂිත ප්‍රතිඵල ඉටු වී නොතිබුණි.

(iv) පානදුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන යටතේ ඉහළ ගුණත්වයෙන් යුතු ජාඩි නිෂ්පාදනය ව්‍යාපෘතිය තෝරාගෙන තිබුණු අතර වැඩසටහන ක්‍රියාත්මක කළ වසම් 03 ට අදාළව එම වසම් භාර සංවර්ධන නිලධාරීන්ගේ වාර්තාවලට අනුව වර්තමානයේ ඉතාමත් සුළු වශයෙන් පමණක් ජාඩි නිෂ්පාදනය සිදුකරනු ලබන අතර ජාඩි ප්‍රතිලාභීන් මුහුණ දී ඇති විවිධ ගැටළු හේතුවෙන් මෙම ව්‍යාපෘතිය අපේක්ෂිත අරමුණු කරා ළඟා වී නොතිබුණි. ජාඩි නිෂ්පාදන බැරල් මිලදී ගැනීම සඳහාවූ ප්‍රසම්පාදන කමිටු වාර්තාව අනුව ලී වැට මිලදි ගැනීමට තාක්ෂණික ඇගයීම් කමිටුව නිර්දේශ කළද එම නිර්දේශය නොසලකා හරිමින් හා ප්ලාස්ටික් බදුන්වල ජාඩි නිෂ්පාදනය සෞඛ්‍යාරක්ෂිත නොවන බව අදාල අංශ පෙන්වා දී තිබියදිත් මෙම ව්‍යාපෘතිය සඳහා ප්‍රතිලාභීන්ගේ ඉල්ලීම මත පමණක් ආහාර ශ්‍රේණියේ ප්ලාස්ටික් බදුන් ලබාදීම මගින් "ඉහළ ගුණත්වයෙන් යුතු

ජාඩි නිෂ්පාදනය"සඳහා වූ ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණ ඉටු වී නොතිබුණු අතර ප්‍රතිලාභීන් 36 දෙනෙකු අතර බෙදා දී තිබූ ප්ලාස්ටික් බඳුන් 108 මිලදී ගැනීම සඳහා වැය කරන ලද රු.442,800 ක මුදල නිෂ්කාර්ය වියදමක් වී තිබුණි.

(v) වලල්ලාවිට ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන යටතේ ක්‍රියාත්මක කළ ව්‍යාපෘති අතර එක් ව්‍යාපෘතියක් වූ බුලත් වගා ව්‍යාපෘතිය සඳහා දරා තිබූ මුළු පිරිවැය රු.7,196,341 ක් වූ අතර එයින් බුලත් වගාව සඳහා ප්‍රතිලාභී ගොවීන්ට කෘමි ප්‍රතිරෝධක දැල් ලබාදීම සඳහා පමනක් රු3,643,669 ක මුදලක් ගෙවා තිබුණද ගොවීන් වෙත කෘමි ප්‍රතිරෝධක දැල් වෙනුවට බුලත් වගාවේ කෘමි ප්‍රතිරෝධයට කිසිදු අදාලත්වයක් නොමැති මායිම් වෙන්කිරීම සඳහා නිවාස හා පාසල් වල භාවිතා කරන දැල් මේ සඳහා සපයා තිබුණි. 2023 වර්ෂයට අදාලව විගණිත දිනය වන විට ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ලබාගත් ප්‍රගති වාර්තාවට අනුව ප්‍රතිලාභීන් 45 දෙනෙකු බුලත් වගාවේ සාර්ථක ප්‍රතිඵල ලබාගෙන නොතිබුණු අතර ඒ අනුව එක් ප්‍රතිලාභියෙකු වෙනුවෙන් රු.80,858 බැගින් වැයකර තිබුණු ව්‍යාපෘතියේ සමස්ථ නිෂ්කාර්ය වැය රු.3,638,610 ක් විය.

(vi) සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන යටතේ වලල්ලාවිට ප්‍රාදේශිය ලේකම් කාර්යාලය යටතේ ක්‍රියාත්මකර කර තිබූ අනෙක් ව්‍යාපෘතිය වූ මණ්ඩගල කුරුදු ගම්මානය සඳහා කුරුදු නිස්සාරණ මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා රු.3,424,311 ක මුදලක් වැයකර තිබුණු අතර ව්‍යාපෘති යෝජනාවට අනුව මෙම කුරුදු නිස්සාරණ මධ්‍යස්ථානයෙන් මාසිකව කුරුදු කොළ භාවිතයෙන් තෙල් බෝතල් 15 ක් හා කුරුදු පොතු භාවිතයෙන් මාසිකව තෙල් බෝතල් 12 ක් ද වශයෙන් නිපදවීමට අපේක්ෂාකර තිබුණද මධ්‍යස්ථානය ආරම්භ කර විගණිත අවස්ථාව වන විට වසරකට අධික කාලයක් ගත වී තිබුණ ද එහි ප්‍රගතිය කොල භාවිතයෙන් තෙල් බෝතල් 04 ක්ද, පොතු භාවිතයෙන් තෙල් බෝතල් භාගයක්ද පමණක් වශයෙන් වූ බව අනාවරණය විය. මේ අනුව මධ්‍යස්ථානයේ අපේක්ෂිත ප්‍රගතිය සියයට 01 කටත් වඩා අඩු බව නිරීක්ෂණය වූ අතර මධ්‍යස්ථානයේ ඉදිරි අපේක්ෂිත ප්‍රගතිය සාර්ථක කරගැනීම සඳහා කිසිදු ප්‍රමාණවත් පිලිගත හැකි වැඩපිළිවෙලක් හඳුන්වා දී නොතිබුණි.

(vii) අගලවත්ත ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන යටතේ ක්‍රියාත්මක කර තිබූ එක් ව්‍යාපෘතියක්වූ හඳුන්කූරු නිෂ්පාදන ව්‍යාපෘතිය සඳහා රු.1,367,250 ක් වැයකර තිබූ අතර ව්‍යාපෘතියෙන් අපේක්ෂිත ප්‍රගතිය ලෙස දිනකට එක් ප්‍රතිලාභියෙකු විසින් බෙහෙත් කිලෝ 8 ක හඳුන්කූරු නිෂ්පාදනය අපේක්ෂා කර තිබුණි. ඒ අනුව මාසිකව එක් ප්‍රතිලාභියෙකු හඳුන්කූරු 224,000 ක් නිෂ්පාදනය කළ යුතු වුවද 2022 සැප්තැම්බර් 30 දිනට ඉදිරිපත් කර තිබූ ප්‍රගති වාර්තා අනුව වසරකට ආසන්න කාලයක් ගතවී තිබුණ ද එකී නිෂ්පාදන ඉලක්කය ළඟා කර ගැනීමට කිසිවකු සමත් වී නොතිබුණි.

2023 පෙබරවාරි 09 දින විගණනය විසින් සිදු කරන ලද භෞතික පරීක්ෂාවට අනුව සහ ඉදිරිපත් වූ ප්‍රගති වාර්තාවලට අනුව ප්‍රතිලාභීන් 30 දෙනාගෙන් 16 දෙනෙකුම එනම්, සියයට 53 ක් හඳුන්කුරු නිෂ්පාදන කටයුතු නතර කර තිබුණි. අමුද්‍රව්‍ය සපයාගැනීමේ අපහසුව, රෝගාබාධ, වෙළඳ පොළ සොයාගැනීමේ දුෂ්කරතාවය හා නිසි සම්බන්ධීකරණයක්, මෙහෙයවීමක් හා පාලනයක් නොමැති වීම ඇතුළු හේතූන් මත ප්‍රතිලාභීන්ගෙන් සියයට 50 කටත් වඩා වැඩියෙන් නිෂ්පාදන නවතා තිබීම මත අදාල ව්‍යාපෘතිය මේ වන විට අසාර්ථක තත්ත්වයට පත්ව තිබුණු අතර දැනට ක්‍රියාකාරී මට්ටමේ පවතින ප්‍රතිලාභීන්ගේද අපේක්ෂිත ප්‍රගතිය සතුටුදායක මට්ටමක නොපැවතුණි.

(viii) අගලවත්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන යටතේ ක්‍රියාත්මක කර තිබූ අනෙක් ව්‍යාපෘතිය වූ අපනයනය සඳහා එළවළු වගා ව්‍යාපෘතිය සඳහා රු.4,094,875 ක වියදම් ඇස්තමේන්තුවක් සකසා තිබූ නමුත් ව්‍යාපෘතිය වෙනුවෙන් දරා තිබුණු වියදම රු.1,655,100 ක් පමනක් විය. ඒ ප්‍රතිලාභීන් 20 දෙනෙකු සඳහා එක් ප්‍රතිලාභියෙකු වෙත පිරිවැය රු.64,800 ක් වූ කෘමි ප්‍රතිරෝධක දැල් රෝල් 3 බැගින් හා පිරිවැය රු.17,955 ක් වූ එළවළු ඇසුරුම් කූඩ 02 බැගින් ලබා දීම සඳහා විය. විගණන නියැදි පරීක්ෂාවට ලක් වූ ප්‍රතිලාභීන් 04 දෙනෙකුම තමන් ලබාගෙන තිබූ දැල් නිසියාකාරව අදාල අරමුණ ඉටුවන පරිදි භාවිතා කර නොතිබුණු අතර ලබා දී තිබුණු ඇසුරුම් කූඩ ද භාවිතා නොකර නිවසේ සුරක්ෂිතව තබා තිබුණි. ව්‍යාපෘති වාර්තාවට අනුව රු.44,000,000 ක වාර්ෂික ආදායමක් අපේක්ෂා කර තිබුණද ප්‍රතිලාභීන් 20 දෙනෙකු සඳහා එක් කන්නයකදී අලෙවියෙන් ලද ආදායම රු.473,000 ක් පමණක් වූ අතර ව්‍යාපෘතියෙන් අපේක්ෂිත නිෂ්පාදනය අක්කර 20 ක භූමි ප්‍රමාණයක අපනයනය සඳහා මෑ කරල් හා පිපිඤ්ඤා නිෂ්පාදනය වුවද අදාල වගා බිම්වල සිදුකල භෞතික පරීක්ෂාවේදී හා ව්‍යාපෘති ප්‍රගති වාර්තාව ප්‍රකාරව පිපිඤ්ඤා වගාකර තිබුණේ එක් ප්‍රතිලාභියෙක් පමණක් වූ නමුත් අපේක්ෂිත වාර්ෂික ඵලදාව පිපිඤ්ඤා කිලෝ ග්‍රෑම් 600,000 ක් විය. එමෙන්ම ව්‍යාපෘති වාර්තාවෙන් අපේක්ෂිත පරිදි මෙසේ වගා කරන එළවළු අපනයනය පිණිස සැකසීම සඳහා වසම් 4 වෙනුවෙන් මධ්‍යස්ථාන 2 ක් ඉදිකිරීමට ද කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කෘෂි ව්‍යාපාර අංශය මගින් හඳුන්වා දුන් අලෙවි මධ්‍යස්ථාන දෙකක් පිහිටුවීමට ද සැලසුම් කර තිබූ නමුත් ඒකී කිසිදු සැලැස්මක් ක්‍රියාත්මක කර නොතිබුණි. එමෙන්ම වගාවේ ස්ථිරසාර නිෂ්පාදනයක් ඇතිකර ගැනීම සඳහා දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂ, නියෝජ්‍ය පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ හා ගොවිජන සේවා සහකාර කොමසාරිස්ගේ සහය ලබාගැනීමට අපේක්ෂා කර තිබුණු අතර ජාත්‍යන්තර වෙළඳපොල සකස් කිරීම සඳහා පේරාදෙණිය කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කෘෂි ව්‍යාපාර සංවර්ධන තොරතුරු සේවයේ සහාය ලබාගැනීමට අපේක්ෂා කර තිබුණි. එසේ වුවද ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී ඉහත

අපේක්ෂිත කිසිදු විශේෂඥ සහායක් ලබාගැනීමට කටයුතු කර නොතිබුණු අතර ව්‍යාපෘතියේ අපේක්ෂිත කිසිදු ඉලක්කයක් කරා ළඟා වී නොතිබුණි.

(ix) ඉංගිරිය ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන යටතේ ක්‍රියාත්මක කර තිබුණු ව්‍යාපාරික විසිතුරු මත්ස්‍ය වගා ව්‍යාපෘති ආරම්භ කිරීම සඳහා ප්‍රතිලාභීන් 61 දෙනෙකු සඳහා රු.6,100,000 ක මුදල් ප්‍රතිලාභ ලබා දී තිබුණු අතර ව්‍යාපෘති වාර්තාවට අනුව පළමු අදියර යටතේ මාළු ටැංකි සාදාගැනීමට අදාල භූමිය සකස් කළ පසු දිරි ගැන්වීම් මුදලින් 50% ක් ගෙවීම (රු. 50000 ක්) හා දෙවන අදියර යටතේ ටැංකි සකස් කර අවසන් වීමෙන් පසු මසුන් තැන්පත් කිරීමේදී ඉතිරි රු.50,000 බැගින් මුදල් නිදහස් කරන බව දක්වා තිබුණද ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සැලසුම් අංශය මගින් සකස් කරන ලද භෞතික ප්‍රගතිය පිළිබඳ වාර්තාවට අනුව ප්‍රතිලාභීන් 27 දෙනෙකු ම මාළු ටැංකි සකස් කර තිබුණද මසුන් තැන්පත් කරන මට්ටමට එම ටැංකි පත් කර නොතිබුණු අතරම මසුන්ද තැන්පත් කර නොතිබුණි. එසේ වුවද එම ප්‍රතිලාභීන් සඳහා නියමිත අවශ්‍යතාවයන් සපුරාලීමෙන් තොරව රු.50,000 බැගින් රු.1,350,000 ක් ගෙවා තිබුණු අතර ව්‍යාපෘතියේ සඳහන් අදාල අවම අවශ්‍යතායවන්වත් සපුරාලීමෙන් තොරව ප්‍රතිලාභීන් දෙදෙනෙකුට එක් අයෙකුට රු.100,000 බැගින් රු.200,000 ක් ගෙවා තිබුණි. විගණනය විසින් අදාල ග්‍රාම නිලධාරි වසම් වල සිදුකළ නියැදි භෞතික පරීක්ෂාවේදී සම්පූර්ණ ප්‍රතිලාභ මුදල් ලබාගත් ප්‍රතිලාභීන් 17 දෙනෙකුම අදාල ව්‍යාපෘතිය සම්පූර්ණ නොකර මාලුටැංකි ඉදිකිරීම් විවිධ මට්ටම් යටතේ අත්හැරදමා තිබුණි. අදාල වගකිවයුතු නිලධාරීන් මේ පිළිබඳව සිය අවධානය යොමුකර නොතිබුණු බැව් භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය වූ අතර ව්‍යාපෘතියේ අපේක්ෂිත ප්‍රතිඵල නොලැබී යාම තුලින් ව්‍යාපෘතිය තුලින් අරමුණු කල ඉලක්ක ලඟාකර ගත නොහැකි වී තිබුණි.

(x) අංක DSK/PLN/08/103 හා 2022 පෙබරවාරි 28 දිනැති දිස්ත්‍රික් ලේකම්ගේ සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන- තිරසර භාවය පවත්වා ගැනීම සඳහා වන උපදෙස් මාලාවෙහි කරුණු අංක 01 (ii) අනුව ප්‍රතිලාභීන්ගේ පෞද්ගලික පරිහරණයට ලබාදී ඇති උපකරණ අදාල නිෂ්පාදන කර්මාන්තය වෙනුවෙන්ම යොදවන්නේද සහ ඒ තුළින් ප්‍රතිලාභීන්ගේ ජීවනෝපාය මාර්ගය වැඩිදියුණු කරන්නේද යන්න වසමේ සංවර්ධන නිලධාරීන්ගේ නිරන්තර අධීක්ෂණයට ලක් කළ යුතු බව දක්වා තිබුණ ද එවැනි නිරන්තර අධීක්ෂණයක් සිදුවන බවට ලිඛිත සාක්ෂියක් විගණනයේදී නිරීක්ෂණය නොවීය. 2021/01 සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහනේ මාර්ගෝපදේශ සංග්‍රහයේ කරුණු අංක 08 අනුවද ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම යටතේ දක්වා ඇති පරිදි ව්‍යාපෘති තිරසාරව පවත්වාගෙන යාමේ වගකීම වසම් භාර ආර්ථික සංවර්ධන නිලධාරි වෙත පැවරී තිබෙන බව සඳහන් කර තිබුණි.එසේ වුවද අදාල වගකිවයුතු නිලධාරීන් මේ පිළිබඳව සිය අවධානය යොමුකර නොතිබුණු බැව්

භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය වූ අතර ව්‍යාපෘතියේ අපේක්ෂිත ප්‍රතිඵල නොලැබී යාම තුලින් ව්‍යාපෘතිය තුලින් අරමුණු කල ඉලක්ක ලභාකර ගත නොහැකි වී තිබුණු බැව් විගණනයට නිරීක්ෂණය විය.

3.2 පාඩු හා හානි

මිය ගිය විශ්‍රාමිකයන්ගේ තොරතුරු කාලීනව යාවත්කාලීන නොකිරීම මත කළුතර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 ක මිය ගිය විශ්‍රාමිකයන් වෙනුවෙන් ගෙවා ඇති රු.5,179,949 ක අධි භාර මුදලක් 2022 දෙසැම්බර් 31 දිනට අයකර ගැනීමට කටයුතු කර නොතිබුණ බව නිරීක්ෂණය විය.

3.3 අනාර්ථික ගණුදෙනු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ජනාධිපති කාර්යාල වැය ශීර්ෂය යටතේ ප්‍රතිපාදන වෙන්කර 2018 හා 2019 වර්ෂවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ක්‍රියාත්මක කර තිබුණු දිළිඳුකම තුරන් කිරීමේ පරමාර්ථය පෙරදැරි කරගත් ග්‍රාම ශක්ති ජනතා වැඩසටහන යටතේ සමිති 140 ක් ලියාපදිංචිකර තිබූ අතර 2022 දෙසැම්බර් 31 දිනට ඉන් සමිති 103 ක් එනම් සියයට 74 ක්ම අක්‍රීයව පැවති බැවින් එදිනට එම සමිති වල බැංකු ගිණුම්වල ශේෂව පැවති රු.55,754,971 ක මුදල් ඌන උපයෝජිතව පැවතුණි.

(ආ) කළුතර දිස්ත්‍රික්කය තුලවූ ප්‍රාදේශීය ලේකම් කාර්යාල බොහොමයක අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා සංවර්ධන නිලධාරීන් සෙවයේ යොදවා සිටි අතර නියැදි පරීක්ෂාවට ලක්වූ ප්‍රාදේශීය ලේකම් කාර්යාල පහක (05) ඵලෙස අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා සේවයේ යොදවා සිටි අතිරික්ත සංවර්ධන නිලධාරීන් අසූ දෙනෙකු (80) වෙනුවෙන් 2022 ජනවාරි සිට 2023 ජනවාරි දක්වාවූ කාලසීමාව වෙනුවෙන් පමණක් වැටුප් වශයෙන් රු.50,745,984 ක් ගෙවා තිබුණි.

3.4 විගණන විමසුම්වලට පිළිතුරු ලබා දීම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත නිකුත් කරන ලද විගණන විමසුම් 23 ක් සඳහා 2023 අප්‍රේල් 28 දිනටත් පිළිතුරු එවා නොතිබුණි.

3.5 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කළුතර දිස්ත්‍රික්කය තුළ ස්වාභාවික ආපදා වලින් පූර්ණ හානියට පත් වන සහ ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් අධි අවදානම් නිසා ඉවත් කලයුතු ලෙස බුලත්සිංහල ප්‍රාදේශීය

ලේකම් කොට්ඨාශය තුල හඳුනාගත් පවුල් සඳහා "නිවසට නිවසක්" සංකල්පය මත නව නිවසක් සමග ඉඩමක් මිලට ගැනීම යටතේ ප්‍රතිලාභ ලබාදීම සඳහා තෝරාගෙන තිබූ 80 ක කුටුම්භයන්ගෙන් 2023 ජනවාරි 01 දින වන විට පුද්ගලයින් 39 දෙනෙකු වෙනුවෙන් නිවාස සහ ඉඩම් විකුණුම්කරුවන්ට බුලත්සිංහල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් උපරිම රු.1,600,000 ක සීමාව යටතේ රු.54,250,000 ක් ගෙවා තිබුණ ද එසේ මුදල් ගෙවූ තෝරාගත් ප්‍රතිලාභීන් නමට මිලදිගත් ඉඩමේ සහ නිවසේ අයිතිය පවරාගෙන හෝ පවරාගත් බවට තහවුරු කරගෙන නොතිබුණි. තවද ඉහත ව්‍යාපෘතිය යටතේ ඉඩම පමණක් මිලදී ගැනීම සඳහා රු.400,000 බැගින් ප්‍රතිලාභ මුදල් ලබාදුන් ප්‍රතිලාභීන් 05 දෙනෙකු විසින් විගණිත දිනය වූ 2023 මාර්තු 31 දින වන විටත් නිවස සෑදීම ආරම්භ කර නොතිබුණු අතර රජයේ ඉඩමක නිවස සෑදීම සඳහා ඉඩම් ලබාදී තිබුණු ප්‍රතිලාභීන් 04 දෙනෙකු විසින් විගණිත දිනය තෙක් නිවස සෑදීම ආරම්භ කර නොතිබුණි.

(ආ) ඉංගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයතුල හඳුනාගත් පවුල් සඳහා "නිවසට නිවසක්" සංකල්පය යටතේ ප්‍රතිලාභීන් වෙත රජයෙන් ලබාදුන් ඉඩමක නිවසක් ඉදිකිරීමට රු.1200000 ක් වූ ලබාදීමේ ක්‍රමවේදය ඔස්සේ ප්‍රතිලාභීන් දෙදෙනෙකු විසින් රජයෙන් ලබාදුන් ඉඩම් හා රු.200,000 බැගින් වූ මුල් වාරික ලබාගෙන තිබුණ ද 2023 මාර්තු 20 වන විගණිත දිනය දක්වා තම නිවාස ඉදිකිරීමේ කටයුතු ආරම්භ කර හෝ නොතිබුණු අතර එම ක්‍රමවේදය යටතේ වාරික මුදල් ලබාගත් ප්‍රතිලාභීන් තිදෙනෙකු නිවාස ඉදිකිරීම් කටයුතු සම්පූර්ණ වශයෙන් අවසන් කර නොතිබුණි. දෙවන වාරික මුදල් ද නිදහස් කර තිබුණ ද නියමිත මට්ටමට ඉදිකිරීම් කටයුතු සිදුකර නොතිබුණු එක් ප්‍රතිලාභියෙකු හට තෙවන වාරික මුදලින් ද රු.100000 ක් නිදහස් කර තිබුණ ද ප්‍රතිලාභියා විසින් 2023 මාර්තු 20 දින වන විටත් ඉදිකිරීම් කටයුතු අවසන් කර නොතිබුණි. ප්‍රතිලාභියා මිලදී ගත් ඉඩමට රු.400,000 ක් සහ එම ඉඩමේ නිවසක් ඉදිකිරීම සඳහා රු.1200000 ක් ලබාදීම යටතේ තෙවන වාරිකය 2019 දෙසැම්බර් 31 දින ලබාගත් එක් ප්‍රතිලාභියෙකු 2023 මාර්තු 20 දින වන විටත් නිවස ඉදිකිරීම සම්පූර්ණ වශයෙන් අවසන් කර නොතිබුණු අතර මේ සම්බන්දයෙන් වන අධීක්ෂණය දුර්වල මට්ටමක පැවතුණි.

(ඇ) ගිනි අවි බලපත්‍ර අළුත්කිරීමේදී අදාළ පාර්ශව වෙත ගිනි අවි අවශ්‍යතාවය තවදුරටත් පවතින බව නිලධාරීන් විසින් තහවුරු කර ගත් බවට සාක්ෂි ඉදිරිපත් නොවූ අතර නුසුදුසු පුද්ගලයින් අත තුවක්කු ගැවසීම තුලින් වනසතුන්ට හා සිවිල් ජන ජීවිතයට බලවත් තර්ජන එල්ලවිය හැකි බැවින් සහ ගිනි අවි අගති සහගතව පරිහරණය කිරීම වැලැක්වීම සඳහා නියමිත කාලසීමාව තුළ ගිනි අවි බලපත්‍ර අළුත් නොකරන බලපත්‍රලාභීන් සම්බන්ධයෙන් නෛතික ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කිරීම දිස්ත්‍රික් ලේකම් හා කොට්ඨාශ භාර පොලිස් අධිකාරීන්ගේ වගකීම වුව ද එම ආයතන අතර නිසි සම්බන්ධීකරණයක් පවත්වා ගනිමින් බලපත්‍ර අළුත් නොකළ ගිනි අවි සඳහා ප්‍රමාණවත් නෛතික ක්‍රියාමාර්ග ගෙන නොමැති බව පානදුර හා හොරණ ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල සිදුකළ නියැදි පරීක්ෂාවේ දී නිරීක්ෂණය විය.

(ඇ) සමාලෝචිත වර්ෂයේ විශ්‍රාම වැටුප් ගෙවීම සම්බන්ධයෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 ක සිදුකල නියැදි විගණන පරීක්ෂාවෙදී ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 කම 2022 වර්ෂයේදී තාවකාලික ගොනු 53ක් මත රු. 15,104,023 ක් විශ්‍රාම වැටුප් වශයෙන් ගෙවා තිබුණු අතර අස්ථානගත වූ ගොනු අස්ථානගත වූයේ කවදා ද, කුමන නිලධාරියෙකු භාරයේ තිබියදී ද යනවග හා ඒවා අස්ථානගත වීමට හේතුව අනාවරණය කරගෙන නොතිබුණි. පවත්වාගෙන යනු ලබන විශ්‍රාම වැටුප් ගෙවීම් අංශයේ විශ්‍රාම වැටුප් ගොනු , මියයාම් හෝ වෙනත් හේතු මත වෙනස් වන ගොනු, නව එකතු කිරීම් වන ගොනු ආදියට අදාළ තොරතුරු විශ්‍රාම ගොනු සම්බන්ධ ලේඛනයට ඇතුලත් කර එම ගොනු විශ්‍රාම වැටුප් නිලධාරීන්ට භාරදීමක් සහ නිලධාරීන් විශ්‍රාම යාම හෝ ස්ථානමාරු වී යන අවස්ථාවලදි නිලධාරීන් භාරයේ පවතින ගොනු විධිමත් පරිදි භාරදීම හා භාර ගැනීම කිසිදු අවස්ථාවක සිදුවී නොතිබුණි. එම හේතුවෙන් ගොනු අස්ථානගත වීම්, ප්‍රමාණවත් ලේඛන ගොනුගත නොවීම්, සම්බන්ධ වගකිව යුතු නිලධාරීන් කවුරුන්ද යන්න තහවුරුවට නිසි ක්‍රමවේදයක් ස්ථාපනය වී නොතිබීම නිසා විශ්‍රාම ගොනු හා ලේඛන නඩත්තුව සම්බන්ධයෙන් ප්‍රමාණවත් වෘත්තිය සැලකිල්ලකින් කටයුතු කර නොතිබුණු බව නිරීක්ෂණය කෙරේ.

(ඉ) ගණනය කිරීමේ දෝෂ හෝ වෙනත් කරුණු මත කළුතර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 ක විශ්‍රාම ලිපිගොනු 47 ක 2022 දෙසැම්බර් 31 දිනට වැඩිපුර ගෙවා ඇති විශ්‍රාම වැටුප් මුදල රු.5,327,820 ක් වූ අතර ඒවා වාරික වශයෙන් අය කර ගනිමින් පැවතුණි. ඒ අතරින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය 2ක විශ්‍රාමිකයන් 05 දෙනෙකු මියයාම හේතුවෙන් රු.330,835 ක් අය නොවී පවතින බව ද නිරීක්ෂණය විය.

(ඊ) හොරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මිල්ලෑව කර්මාන්තපුරය දිගුකාලීන බදු පදනම මත ඉඩම් ලබා දී ඇති පෞද්ගලික ආයතන 13 අතරින් 2015 සහ 2016 වර්ෂ වලදී ඉඩම් වෙන්කර දුන් ආයතන 03 ක් සඳහා සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් බදුකර හෝ බදු අනුමත ලිපි නිකුත් කර නොතිබීම මත එම ආයතනවලින් කිසිදු බදු ආදායමක් අය නොවන අතර ඒවා නිකුත් කරන තෙක් දළ තක්සේරු මත බදු අය කිරීමට 2021 ඔක්තෝබර් 13 දිනැති අංක 2021/06 දරණ චක්‍රලේඛය මඟින් ඉඩම් කොමසාරිස් ජනරාල් විසින් ප්‍රදේශීය ලේකම්වරුන්ට උපදෙස් ලබා දී තිබුණි. එහෙත් හොරණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ බදු මුදල් තක්සේරු කමිටුව 2022 වර්ෂයේ අප්‍රේල් මස 06 හා 27 යන දිනවල රැස් වුවද, උක්ත චක්‍රලේඛය නිකුත් කර අවුරුදු 01 මාස 04 ක් ගත වී තිබුණ ද එම ආයතන භුක්ති විඳින රජයේ ඉඩම් සඳහා තක්සේරුවක් ලබා දී නොතිබුණි. ඒ අනුව උක්ත චක්‍රලේඛය ප්‍රකාරව බදු අයකර ගැනීම සඳහා ඉදිරි පියවර ගෙන නොතිබුණි. තවද ඉහත මිල්ලෑව කර්මාන්තපුරයේ දිගු කාලීන බදු පදනම මත ලබා දී තිබූ ඉඩම් 13 න් ඉඩම් කැබලි 05 ක් පරිහරණය කරන කර්මාන්ත හිමිකරුවන් විසින් දිගුකාලීන බදු අනුමැතිය ලබාගැනීම පිණිස යැවීමට ලේඛන කිසිවක් භාර දී නොතිබීම මෙන්ම ලේඛන අඩුවෙන් භාරදී ඇති අවස්ථා පැවතීම

නිසා බදු අනුමැතිය ලබාගැනීමට, තක්සේරුව සිදුකිරීමට හා බදුකරය සකස් කිරීම ප්‍රමාද වීම මත රජයට අයවිය යුතු බදු ආදායම නිසි කලට ලබාගැනීමට නොහැකිව තිබුණි.

(උ) භාණ්ඩාගාර ලේකම්ගේ 2021 සැප්තැම්බර් 29 දිනැති අංක PFD/PMD/Cir/2021/01 දරණ මුදල් චක්‍රලේඛයේ 2.1 ඡේදය ප්‍රකාරව ප්‍රාදේශීය ලේකම් විසින් නම් කරනු ලබන නියෝජිතයන් දෙදෙනෙකුගෙන් සමන්විත ත්‍රිපුද්ගල කමිටුවක් මගින් උක්ත චක්‍රලේඛයේ අංක 2.3 යටතේ සඳහන් කර ඇති සුදුසුකම් පරීක්ෂා කර සනාථ කිරීමෙන් අනතුරුව ප්‍රජා පාදක සංවිධාන වෙත ඉදිකිරීම් වැඩ කොන්ත්‍රාත් පැවරිය හැකි අතරම මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ ජනරාල්ගේ 2022 නොවැම්බර් 29 දිනැති අංක 06 දරණ චක්‍රලේඛය ප්‍රකාරව දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් ලියාපදිංචි කරන ලද ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන/ රාජ්‍ය නොවන සංවිධාන වෙතින් චක්‍රලේඛයේ දක්වා ඇති ලේඛන වාර්ෂිකව ලබාගෙන සංවිධානයේ මුල් ගොනුව යවත්කාලීන කලයුතු වුවද, පානදුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් එම තොරතුරු යාවත්කාලීන නොකර, එනම් ඉහත කරුණු වලට පටහැනිව ගිවිසුම්ගත වන අවස්ථාවේදී අදාල සමිතිය සක්‍රීය ද අක්‍රීය ද යන්න තහවුරු කරගැනීමකින් තොරව 2022 වර්ෂයේ කොන්ත්‍රාත් 6 ක් සඳහා ස්වේච්ඡා සමිති 5 ක් සමඟ ගිවිසුම්ගත වී ඉටු කළ වැඩ වෙනුවෙන් රු.3,721,039 ක් ගෙවා තිබුණි.

(ඌ) කලුතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සමාජ සේවා අංශයේ නිලධාරීන්ගේ ඉදිරි වැඩ හා කළ වැඩ සටහන් නියමිත පරිදි ඉදිරිපත් නොකිරීම, ක්‍රියාකාරී සැලසුම් ඉදිරිපත් නොකිරීම්, ඉදිරිපත් කරන ලද ක්‍රියාකාරී සැලසුම් අධීක්ෂණ නිලධාරීන් විසින් අනුමත නොකිරීම්, රැකියා විස්තර යල්පැන තිබීම ආදිය හේතුවෙන් නිලධාරීන් නිසි අධීක්ෂණයෙන් තොරව කටයුතු කිරීම නිසා කාර්යසාධනය අඩු මට්ටමකින් පැවති අවස්ථා නිරීක්ෂණය විය.

4. තිරසාර සංවර්ධනය

4.1 තිරසාර සංවර්ධන අරමුණු ඉටු කිරීමේ ප්‍රගතිය

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2030 තිරසාර සංවර්ධන න්‍යාය පත්‍රයේ අරමුණු 17 ක් යටතේ සංවර්ධන ක්‍රියාකාරකම් හඳුනාගෙන තිබුණ ද විගණනයට ඉදිරිපත්වූ තොරතුරුවලට අනුව සමාලෝචිත වර්ෂයේ දී තිරසාර සංවර්ධන අරමුණු අංක 1 හා අංක 2 සඳහා පිළිවෙලින් එනම් සියළු තැන්හි පවතින සෑම ආකාරයකම දුගී බව අවසන් කිරීම හා යහපත් පෝෂණ තත්ත්වයන් දිනාගෙන තිරසාර කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීම යටතේ වියළි ආහාර මළු සහ ඉන්දියන් සහනාධාර යටතේ සහල් සහ කිරිපිටි බෙදාහැරීම සිදුකල බව දක්වා තිබුණ ද එම වැඩසටහන කොවිඩ් වසංගතය හා ආර්ථික අර්බුදය හේතුවෙන් ලංකාව පුරා ක්‍රියාත්මක කරන ලද ජාතික වැඩසටහනක් විය. තිරසාර සංවර්ධන සැලසුමෙහි අන්තර්ගත අරමුණු 17 අතරින් අරමුණු අංක 1, 2 හා 6 සඳහා ඉහත සඳහන් කරන ලද ක්‍රියාකාරකම් හැර අනෙකුත් අරමුණු

සාක්ෂාත් කර ගැනීමට 2022 වර්ෂයේදී සංවර්ධන ක්‍රියාකාරකම් සිදුකල බවට විගණනයට සාක්ෂි ඉදිරිපත් නොවුණි.

5. යහපාලනය

5.1 මහජනතාව වෙත සේවා ඉටු කිරීම

මහජනතාව වැඩිපුරම පැමිණෙන ආයතනයන් හි වැඩිම ඉල්ලුමක් ඇති සේවා සඳහා කාර්යසාධක දර්ශක හඳුනාගැනීම හා ඒවා ඉටුකරන ප්‍රමාණය මැනීම සඳහා රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ 2020 ජනවාරි 24 දිනැති ස්වදේශ කටයුතු ගිණුම් චක්‍රලේඛ අංක 02/2018(II) මගින් සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත උපදෙස් ලබා දී තිබුණි. ඉලක්කගත සේවාවන් හා ඉලක්කයන් අමාත්‍යාංශයට ඉදිරිපත් කිරීම පිළිබඳව විගණනය වෙත පිළිගත හැකි ප්‍රමාණවත් තොරතුරු ඇගයීම් සිදුකල හැකි පරිදි නියමිත කාල වකවානුව තුල ඉදිරිපත් නොවුණු අතර, එම ඉලක්කයන් සඳහා අමාත්‍යාංශයේ අනුමැතිය ලැබුණේ ද යන්න ද තහවුරු නොවීය. ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් ඉදිරිපත් කරන ලද කාර්තුමය ප්‍රගතිය සහ වර්ෂ අවසානයට ඉදිරිපත් කරන ලද ප්‍රගතිය එකිනෙකට වෙනස් වීම, කිසියම් සේවාවක ඉලක්කය ඉදිරිපත් කිරීමේදී ඒවා සංඛ්‍යාත්මකව ඉදිරිපත් කළ යුතු බව ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත නිශ්චිතව දක්වා නොතිබීම හා තාත්වික දර්ශක හඳුනාගෙන නොතීබීම ආදී හේතුමත. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2022 වර්ෂය සඳහා වූ කාර්ය සාධන දර්ශක හඳුනාගැනිම, ඉලක්ක පිහිටුවීම හා ළඟා කර ගැනීම හා ඒවායේ ප්‍රගතිය වාර්තා කිරීම, මැන බැලීම, ඇගයීම හා විතැන්වීම සම්බන්ධව පසු විපරම් කිරීමේ ක්‍රියා පටිපාටිය අපේක්ෂිත මට්ටමින් ඉටුවී නොතිබුණු බව විගණනයට නිරීක්ෂණය විය.

6. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ ඇමුණුම 2 ආකෘතිය ප්‍රකාරව 2022 වර්ෂය වෙනුවෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා පිළියෙල කළ මානව සම්පත් සැලැස්ම විගණනයට ඉදිරිපත් නොවීය.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා පුහුණු සැලැස්මක් සකස් කර තිබුණ ද යටෝක්ත චක්‍රලේඛයේ දක්වා ඇති විධිවිධාන ප්‍රකාරව පුහුණු අවශ්‍යතා තෘප්ත කරන ආකාරයට සැලැස්ම සකස් කිරීම හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සිදු කර නොතිබුණ බව නිරීක්ෂණය වූ අතර 2022 වර්ෂය සඳහා රු.2,528,800 ක් වැයකර පුහුණු වැඩසටහන් 47 ක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කළ ද විගණනයට ඉදිරිපත් කල 2022 පුහුණු ප්‍රගතියට අනුව රු. 636,232 ක් වැයකර පුහුණු වැඩසටහන් 24 ක් පමණක් ක්‍රියාත්මක කර තිබුණි. එය සැලසුම් කරන ලද පුහුණු ප්‍රතිපාදන වියදමින් සියයට 25

පමණක් වූ අතර සේවකයන්ගේ ධාරිතාව හා අභිප්‍රේරණය ඉහළ නැංවීම සඳහා නිරන්තරයෙන් අවශ්‍යවන සැලසුම් කළ විෂයානුබද්ධ පුහුණු වැඩසටහන් 03 ක් 2022 වර්ෂයේදී පවත්වා නොතිබුණි. සමාලෝචිත වර්ෂය තුලදී ඉන්ධන, ජලය, විදුලිය ආදී රාජ්‍ය වියදම් අතිශය සීමා කිරීමද මේ සඳහා බලපා තිබුණි.

(ඇ) උක්ත චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව සමස්ථ කාර්ය මණ්ඩලය සඳහා වාර්ෂික කාර්තසාධන ගිවිසුම් අත්සන් කර නොතිබුණි..

(ඇ) ඒකාබද්ධ සේවාවන්හි නිලධරයන් සඳහා වන වාර්ෂික ස්ථාන මාරු ප්‍රතිපත්තියේ 2.2.2 අනුව එකම සේවා ස්ථානයක වසර 05 කට වැඩි කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරීන් ස්ථාන මාරුවීම් වලට යටත් වන බව දක්වා තිබුණ ද දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා නියැදි පරීක්ෂාවට ලක්වූ ප්‍රාදේශීය ලේකම් කාර්යාල පහක (05) 2022 දෙසැම්බර් 31 දිනට සේවා කාලය වසර 05 ඉක්ම වූ නිලධාරීන් 256 දෙනකු සේවය කරන බව විගණනයට නිරීක්ෂණය විය.

ආර්.ජී. හෙට්ටිආරච්චි
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

ආර්. ජී. හෙට්ටිආරච්චි
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය